**ISBN 978- 955-4563- 71- 1**

# සංවර්ධනය: සංකල්පීය ගොඩනැගීම සහ ක්‍රියාකාරීත්වය

**ආචාර්ය එල්. ඩී. සරත් විතාරන**
**සමාජවිද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**

## සංක්ෂේපය

***සංවර්ධනය 20 වන සියවසේ දෙවන අර්ධ ආරම්භයේ සිට ලෝක මානව සමාජය තුළ ඉතා දැඩි ලෙස අවධානයට ලක් වූ ක්ෂේත්‍රයන් අතරින් ඉතා වැදගත් ක්ෂේත්‍රයකි. සංවර්ධනය යන යෙදුම නිතරම සෘජු හෝ අනියම් ලෙස සංවර්ධන අධ්‍යයනය, සංවර්ධනයේ ගැටලු, ඌන සංවර්ධනය, සංවර්ධනය වෙමින් පවතින රටවල්, අඩු සංවර්ධිත රටවල්, සංවර්ධන සමායතනයන්, සංවර්ධන ආධාර, සංවර්ධන උපාය මාර්ග, සංවර්ධන ප්‍රතිපත්ති යනාදි වශයෙන් භාවිත කරයි. කෙසේ වෙතත්, සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? සහ ක්‍රියාකාරී භාවිතයක් වශයෙන් පසුගිය කාල සීමාවේදී එය ලෝක මානව සමාජය තුළ ක්‍රියාත්මක වී ඇත්තේ කෙසේද? යන ප්‍රශ්න පසුගිය දශක ගණනාව තිස්සේ පුළුල් ලෙස සාකච්ඡාවට ලක්ව ඇත. මේ අනුව මේ ලිපියේ මූලික අරමුණ ඉහතින් සඳහන් කළ ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කරමින් සන්දර්භ විශ්ලේෂන ක්‍රමවේදය (Content analysis) ඔස්සේ 20 වන සියවසේ දෙවන අර්ධයේ සිට සංවර්ධන සංකල්පය ගොඩනැගීම සහ එහි ක්‍රියාකාරී භාවිතය පිළිබඳව සලකා බැලීමයි.***

**මුඛ්‍ය පදඃ සංවර්ධනය, සංවර්ධන දෘෂ්ටිවාදය, නවීනත්වය, සංවර්ධන දර්ශක.**

## හැඳින්වීම

සාම්ප්‍රදායිකව, සංවර්ධනය යන්න රටක සුභසාධනය හා ජනතාවගේ ජීවන තත්ත්වය සහ අවස්ථාවන්ගේ වැඩිවීමක් මෙන්ම වාණිජකරණය, කාර්මීකරණය, නවීකරණය හෝ ගෝලීයකරණය හා සම්බන්ධ වූ ක්‍රියාවලියක් සේම රාජ්‍යය සුජාතකරණයවීම හා සම්බන්ධ ක්‍රියාවලියක් යනාදි වශයෙන් හැඳින්විය හැකිය. 20 වන සියවසේ මැද භාගයේ සිට සංවර්ධනය ලෝක මානව සමාජයට කොතරම් වැදගත් වී ඇත්ද යත් මාර්ක් එඩෙල්මාන් සහ ඇන්ජලි හෝගාර්ඩ් පෙන්වා දෙන්නේ සංවර්ධනය ජීවිතය හා මරණය පිළිබඳ ගැටලුවක් සේම, අත්‍යාවශයක ගෝලීය අභියෝගයක්, දැඩි ලෙස විවාද සම්පන්න න්‍යායාත්මක ක්ෂේත්‍රයක් බවට පත්ව ඇති බවයි (Edelman, and Hougerud, 2005: 1). කෙසේ වෙතත් 20 වන සියවසේ මැද භාගයේ සිට ගතික අධ්‍යන ක්ෂේත්‍රයක් සහ ක්‍රියාකාරී භාවිතයක් ලෙස සංවර්ධනය ක්‍රියාත්මක වූ ආකාරය සම්බන්ධයෙන් වර්ධනය වී ඇති අතෘප්තිමත් බව හේතු කොට ගෙන වඩාත් මෑත කාලයේදී සංවර්ධනය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති විවේචනාත්මක විග්‍රහයන් පිළිබඳවද සලකා බලමින් එඩෙල්මාන් සහ හෝගාර්ඩ්, එය (සංවර්ධනය) තනි පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් තරඟ කළ යුතු සංකල්පීය අනාගතයේ පරමාදර්ශයක්ද? එසේත් නැත්නම් එය විනාශකාරී මායාවක්ද? මානව විද්‍යාවේ දුෂ්ඨ නිවුන් සොහොයුරෙක්, බටහිර නවීනත්වය පිළිබඳ ඉතිහාසයේ ගුප්ත අසාර්ථක පරිඡේදයක් ද? යන ප්‍රශ්නද අසයි (Edelman and Hangerud, 2004: 86). මේ අනුව සංවර්ධනය පිළිබඳ සංකල්පකරණය සහ එහි ක්‍රියාකාරී භාවිතය හුදෙක් සුභවාදී සමාජ වෙනස් වීමක් වශයෙන් පමණක් විග්‍රහ නොකළ යුතු බව පැහැදිලිය.

මේ ලිපියේ මුල් කොටස 20 වන සියවසේදී සංවර්ධන සංකල්පය සොයා ගැනීම සහ ඊට බලපෑ පසුබිම පිළිබඳ සාකච්ඡා කරන අතර දෙවැනි කොටසින් සංවර්ධන සංකල්පය හා සම්බන්ධ පාරිභාෂිතයන් පිළිබඳව කෙටියෙන් අවධානය යොමු කරනු ලැබේ. ලිපියේ තුන්වන කොටසේදී සංවර්ධනය පිළිබඳ දෘෂ්ටියේ ක්‍රමානුකූල වෙනස්වීම පිළිබඳව සාකච්ඡා කෙරේ. සිව්වැනි කොටස සංවර්ධන කතිකාව සහ ලෝක මානව සමාජය තුළ සංවර්ධනය යන්න ක්‍රියාත්මක වීමේ ස්වභාවය පිළිබඳව මෙම ලිපියේදී කරන සාකච්ඡාව පිළිබඳ කෙටි සමාලෝචනයකි.

## I කොටසඃ සංවර්ධනය සොයා ගැනීම

සංවර්ධනය යන වචනයට යම් ප්‍රමාණයකින් සමීපත්වයක් සහිත 'වර්ධනය,' 'ප්‍රගතිය,' 'දියුණුව' යනාදි වචනවලින් කියැවෙන අදහස් පිළිබඳව දිගු කලක් තිස්සේ විද්වත් ශික්ෂාවන් තුළ කතිකාවට ලක් වී ඇතත්, ද්‍රව්‍යාත්මක දියුණුවක් අපේක්ෂාවෙන් සිතා මතා සැලසුම් කරන්නා වූ ක්‍රියාවලියක් වශයෙන් සහ විද්වත් ශික්ෂාවන්වලදී, විශේෂයෙන්ම සමාජීය විද්‍යා ක්ෂේත්‍රය තුළ, විවාදාසම්පන්න න්‍යායාත්මක කතිකාවක් වශයෙන් සංවර්ධනය යන්න සුවිශේෂී ආකාරයෙන් අවධානයට ලක් වන්නේ දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුවය. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව යුද්ධයෙන් පොඩිපට්ටම් වූ යුරෝපය නැවත ගොඩනැගීම බටහිර බලවතුන් මුහුණ දුන් බරපතලම අභියෝගය විය. මේ ක්‍රියාවලියට උර දිය

**ISBN 978- 955-4563- 71- 1**

හැකි සහ එම ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ ආයතනයක අවශ්‍යතාව හඳුනා ගැනීමේ ප්‍රතිඵලය වූයේ ''නැවත ගොඩනැගීම සහ සංවර්ධනය සඳහා වූ "ජාත්‍යන්තර බැංකුව" හෙවත් පසුව "ලෝක බැංකුව" (*International Bank for Reconstruction and Development*, later *World Bank*) ආරම්භ වීමයි. මේ හා සමගාමීව දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව සිදු වූ ඊළඟ වැදගත්ම දෙය වූයේ ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර බලවතුන් විසින් ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමෙරිකානු ලෝකයේ බහුජන දුගීභාවය සොයා ගැනීමයි. වෙළඳපොළ අර්ථ ක්‍රමය යටතේ සංවර්ධනය යන්න පරමාදර්ශී ආර්ථික විද්‍යාත්මක මිනුම් දණ්ඩක් ලෙස ඒක පුද්ගල ආදායම (Per capita income) යන්නට අදාළව නිර්වචනය කරන ලැබූ විට, සමෘද්ධිමත් රටවලට සාපේක්ෂව මූල්‍යමය වශයෙන් සහ ජීවන මට්ටම අනුව ලෝක ජනගහනයෙන් 70% ක් පමණ දුගීන් බවට පත් විය (Escobar, 1999: 382). ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකකට සමානවූ මේ දුගීන් ජීවත් වූ ආසියානු, අප්‍රිකානු, ලතින් ඇමෙරිකානු ලෝකයේ රටවලින් අතිවිශාල බහුහතරයක් පහත සඳහන් ආකාරයේ අංග-ලක්ෂණවලින් යුක්ත වූයේය.

01. පුළුල්ව පැතිරුණු දුප්පත්කම සහ මන්දපෝෂණය
02. නිෂ්පාදන ක්‍රියාවලියේදී කෘෂිකර්මාන්තයට ප්‍රධාන තැනක් හිමිවීම
03. ආර්ථික ව්‍යුහය කැපී පෙනෙන ද්වීදෛවතාවයකින් යුක්තවීම (dualism in economic structure)
04. වේගයෙන් වර්ධනය වන ජනගහනය
05. වේගයෙන් වර්ධනය වන නාගරික ජන සංඛ්‍යාව
06. උග්‍ර රැකියා වියුක්තිය සහ ඌන සේවා නියුක්තිය
07. දේශපාලන අස්ථාවරභාවය සහ පුළුල්ව පැතිරුණු අල්ලස සහ දූෂණය
08. වේගයෙන් පරිහානියට පත්වන පරිසරය
09. තාක්ෂණික සහ විද්‍යාත්මක දැනුම අවම මට්ටමක පැවතීම (Todaro, 2012; Szirmai, 2005).

ආසියා අප්‍රිකා සහ ලතින් ඇමරිකානු ලෝකයේ බහුජන දුගීභාවය පිළිබඳ මේ තාර්කික සොයා ගැනීම ලෝක සංස්කෘතිය සහ දේශපාලන ආර්ථිකය වැදගත් ප්‍රතිව්‍යුහගත කිරීමකට මග හෙළි කළේය. යුද්ධය පිළිබඳ කතිකාව නව විෂය පතයකට, නව භූගෝලීය දිශානතියක් (එනම් තුන්වන ලෝකය) දෙසට යොමු වූ අතර තුන්වන ලෝකයේ දුගීභාවයට එරෙහිව සටන් කිරීම යන්න වැදගත් සටන් පාඨයක් ලෙස ඉස්මතු වූයේය. මේ සටන සාධාරණීකරණය කිරීමට ජාත්‍යන්තර (ධනේශ්වර) දේශපාලන ලෝකය තුළ ලෝක බලවතුන් කළ ව්‍යක්ත කරුණු ගෙනහැර දැක්වීම සිත්ගන්නා සුලුය. දෙවන ලෝක යුද්ධයෙන් පසු බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව නියෝජනය කළ සහ 1960 දශකයේදී බ්‍රිතාන්‍යයේ අගමැතිවරයෙක් වූ හැරල්ඩ් විල්සන් (Harold Willson) 1950 දශකයේ මුල් භාගයේදී "ලෝක දුගීභාවය පිළිබඳ සටන" (*The war on world poverty: An appeal to the conscience of mankind*, 1953) යන තේමාව යටතේ ලියූ කෘතියේදී බිලියන 1.5 කටත් වැඩියෙන් හෙවත් ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් පමණ ජනගහනයක් උග්‍ර සාගතයෙන් පෙළීම නිසා ඔවුන් පෝෂණමය රෝගවලට ගොදුරු වන බව සඳහන් කළ අතර මේ සාගතය ඔවුන්ගේ දුගීභාවයට, අපවිත්‍රත්වයට සහ අසරණභාවයට හේතුවන බවද පෙන්වා දුන්නේය (උපුටා ගැනීම Escobar, 1999: 382). හැරල්ඩ් විල්සන් පමණක් නොව දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා වූ හැරි ට්‍රෑමන් (Harry Truman) 1949 (ජනවාරි 20) දී ඉදිරි වර්ෂය සඳහා ඉදිපත් කළ (කරුණු හතරකින් යුත්) ඇමෙරිකානු රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හතරවැනි කරුණු සෘජුවම ලෝකයේ දුගී භාවයෙන් පෙළෙන ප්‍රදේශ සහ එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම, ඔවුන් සමාජ-ආර්ථිකමය වශයෙන් නගා සිටුවීම අරමුණ කරගත් ව්‍යක්ත ප්‍රකාශයක් වූයේය.

ලෝක ජනගහනයෙන් හරි අඩක් අන්ත අසරණ තත්ත්වයක් යටතේ ජීවත් වේ. ඔවුන්ට ප්‍රමාණවත් තරම් ආහාර නොමැත. ඔවුන් ලෙඩ රෝගවල ගොදුරුය. ඔවුන්ගේ ආර්ථික මට්ටම ඉතාම පහළ මට්ටමක පවතී. ඔවුන්ගේ දුගීභාවය ඔවුන්ට මෙන්ම සමෘද්ධිමත් රටවලට ද තර්ජනයකි... (උපුටා ගැනීම Rist, 2002: 71).

හැරල්ඩ් විල්සන්, හැරි ට්‍රෑමන් වැනි ජාත්‍යන්තර වශයෙන් බලවත් රාජ්‍ය නායකයන්ගේ ඉහත සඳහන් ආකාරයේ ප්‍රකාශයන් 1940 දශකයේ අගභාගයේ සිට නිරන්තරයෙන් ඉදිරිපත් වූයේ සංවර්ධනය පිළිබඳව වූ යුගයකට සමස්ත ලෝකයම සම්බන්ධ කරමිනි. ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකානු කලාපයේ අතිශය බහුතරයක් රටවල නිරපේක්ෂ දුගීභාවයේ ස්වභාවය සහ සමාජ අසහනයන්, ඒ අනුව එකී රටවල් විසින් සමෘද්ධිමත් ප්‍රදේශවලට කළ හැකි අවධානම් සහගත තත්වය පිළිබඳව මේ කාලයේදී පුළුල්ව අවධානයට ලක් විය. දුගී රටවල් නිසා සමෘද්ධිමත් කලාපයන්වල අස්ථාවරත්වයක් ඇති වීමට පෙර දුගී රටවල දුගීභාවය සඳහා යමක් කළ යුතුය යන අවබෝධය පුළුල් වශයෙන් සමාජගත වීම 1940 දශකයේ අගභාගයේ පසු සිදු වූ වැදගත්ම දෙයකි.

**ISBN 978- 955-4563- 71- 1**

කෙසේ වෙතත් බටහිර බලවතුන්ගේ මේ සුවිශේෂී සොයා ගැනීම දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව ලෝක මානව සමාජය තුළ හඳුනාගත හැකි වූ දේශපාලන-ආර්ථික විභේදනය ආශ්‍රිතව ලෝකයේ රටවල් සමූහකරණය වීම හා සම්බන්ධ වූවක් බව අමතක නොකළ යුතුය. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව එක්සත් ජනපදය සහ සෝවියට් සංගමය කේන්ද්‍ර කොට ගෙන ලෝකයේ (දක්ෂිණාංශික සහ වාමාංශික වශයෙන්) බලවත් දේශපාලන කඳවුරු දෙකක් බිහිවීමත්, ඒ අනුව (වාමාංශික) සෝවියට් සංගමයේ දේශපාලන ව්‍යාප්තිය වැළැක්වීම 1940 දශකයේ අගභාගයේදී "ලෝක දුගීභාවයට එරෙහි සටන" ආරම්භ කිරීමේ (දක්ෂිණාංශික) බටහිර බලවතුන්ගේ අභිප්‍රේරණය වුවත්, මෙහි තාර්කික වැදගත්කම නම් ලෝක ජනගහනයෙන් අතිබහුතරයක් වෙසෙන ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමෙරිකානු ලෝකයේ ඉරණම සමෘද්ධිමත් ලෝකයට ද බලපාන්නේය, ලෝකයේ එක් පෙදෙසක් දුගීභාවය, අයහපත් සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව, ලෙඩ-රෝග මන්දපෝෂණය සහ සාගින්නෙන් පෙළෙද්දී අනෙකුත් ප්‍රදේශවලට යහතින් පැවතිය නොහැකිය යන්න බලවත් ලෝකය විසින් ද පිළිගනු ලැබීමයි.

## II කොටසඃ සංවර්ධනය හා සම්බන්ධ පාරිභාෂික නාමකරණය

දුගී භාවයෙන් පෙළෙන රටවලට ආවේණික ලක්ෂණ ලෙස හඳුනා ගත් ඉහතින් සඳහන් කළ ලක්ෂණ කීපයක් හෝ වැඩි ගණනක් සහිත වූ ආසියානු, අප්‍රිකානු සහ ලතින් ඇමෙරිකානු ලෝකය සහ ඒ වන විට සමෘද්ධිමත් ආර්ථික මට්ටමක් අත්පත් කරගෙන සිටි උතුරු ඇමරිකානු සහ බටහිර යුරෝපීය රටවල් අතර වූ පරතරය හඟවන්නා වූත්, මේ කාලය වනවිට ආර්ථික - දේශපාලනික මතවාදයන් පදනම් කොට ගෙන ලෝකය බෙදී ගිය ආකාරය හඟවන්නා වූත් පාරිභාෂික නමෝද්දේශනයන්[1] 1940 දශකයේ අගභාගයේ, සිට සංවර්ධන කතිකාවට එක්විය. එම පාරිභාෂික නමෝද්දේශනයෙන් පිළිබඳව සැකෙවින් සලකා බැලීම මෙකල සංවර්ධනය පිළිබඳව ගොඩනැගුණු කතිකාවේ ස්වභාවය අවබෝධ කර ගැනීම පහසුවනු ඇත.

සංවර්ධන මට්ටම අනුව ලෝක මානව සමාජය තුළ හඳුනාගත හැකි වූ ද්විදෛවතාවය (dualism) නිරූපණය කරන වැදගත් පාරිභාෂික යුගලන යෙදුමක් වූයේ ගෝලීය උතුර නැත්නම් උතුරේ රටවල් සහ ගෝලීය දකුණ හෙවත් දකුණේ රටවල් යන්නයි. ගෝලීය උතුර හෙවත් උතුරේ රටවල් ලෙස හඳුන්ව න ලද්දේ යුරෝපය, ජපානය, ඕස්ටේලියාව, නවසීලන්තය සහ උතුරු ඇමරිකානු කලාපයේ ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාවයි. ගෝලීය දකුණ හෙවත් දකුණේ රටවල් ලෙස හැඳින්වූයේ ආසියා. අප්‍රිකා, ලතින් ඇමරිකානු කලාපයේත්, කැරිබියානු සහ පැසිපික් කලාපයේ ඉතිරි රටවල්ය. උතුරු දකුණු රටවල් යන්න මූලික වශයෙන්ම සමකයට උතුරින් සහ දකුණින් පිහිටි රටවල් පදනම් කරගත් බෙදීමක් වන නමුදු සංවර්ධන කතිකාවට අනුව මෙහිදී ඇති වූ ගැටලුව වූයේ උතුරේ සියලුම රටවල් සංවර්ධිත රටවල් නොවීමත් දකුණේ සියළුම රටවල් පහළ සංවර්ධන මට්ටමක් සහිත රටවල් නොවීමත්ය (Willis, 2005: 15-6). ඒ කෙසේ වෙතත් 1980 දශකයේදී පවා සංවර්ධන කතිකාව තුළ මේ උතුරු සහ දකුණු පාරිභාෂික යුගලනය භාවිතා වූ බව හඳුනාගත හැකිය.

තුන්වැනි ලෝකය (Thrid World)[2] යන්න සංවර්ධන කතිකාව ආරම්භ වීමෙන් පසු ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු කලාපයේ රටවල් හැඳින්වීමට බෙහෙවින් භාවිත කළ යෙදුමකි. මේ යෙදුම සංවර්ධන කතිකාව ආරම්භවූ යුගයේ ලෝකය තුළ හඳුනාගත හැකිවූ දේශපාලන-ආර්ථික විභේදනය ආශ්‍රිතව ලෝකයේ රටවල් සමූහකරණය වීම හා සම්බන්ධ පාරිභාෂික වචනයක්ද වේ. තුන්වැනි ලෝකයේ රටවල් ලෙස හඳුන්වන ලද්දේ ආසියා, අප්‍රිකා, ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු රටවල්ය. මේ වචනය මූලික වශයෙන් නොබැඳි රටවල් (non-aligned naton), එනම් පශ්චාත් යුධ සමයේ ප්‍රධාන බල කඳවුරු දෙක වූ සමාජවාදී සෝවියට් සංගමයට සහ ධනවාදී ඇමෙරිකාවට නැඹුරු නොවූ රටවල් හැඳින්වීම සඳහා ද භාවිත කරන ලද්දේය (Willis, 2005: 16). මීට සමගාමීව පළමු වැනි ලෝකය ලෙස සලකන ලද්දේ කාර්මිකකරණය වූ ධනවාදී රටවල් හෙවත් බටහිර යුරෝපය, ඇමරිකාව, ජපානය, නවසීලන්තය, ඔස්ට්‍රේලියාව හා කැනඩාවයි. දෙවැනි ලෝකය ලෙස සෝවියට් සමාජවාදී සංගමය ප්‍රමුඛ නැගෙනහිර යුරෝපයේ කොමියුනිස්ට් රටවල් සළකන ලදී. පළමු වැනි, දෙවැනි, සහ තෙවැනි ලෝකය වශයෙන් වූ වර්ගීකරණයෙන් ධූරාවලියක් පිළිබඳ අදහසක් ගම්‍ය කළා සේම තුන්වැනි ලෝකය යන්නෙන් සංවර්ධන මට්ටමේ පහළම තලයේ සිටි රටවල් අදහස් කළ බව පැහැදිලිය. දෙවැනි

[1] මෙම ලිපියේ සන්දර්භය තුළ **පාරිභාෂික නමෝද්දේශනය** යන්නෙන් අදහස් කරන්නේ කිසියම් සංකල්පයක් උදෙසා යොදන පාරිභාෂික වචන මාලාවයි.

[2] තුන්වන ලෝකය යන අරුත් දෙන "Third World" යන ඉංග්‍රීසි වචනය ප්‍රංශ භාෂාවේ ***tiers monde*** යන වදනේ ඍජු පරිවර්තනයකි. පූර්ව යටත්-විජිත රාජ්‍යයන් හැඳින්වීම සඳහා සංවර්ධන කතිකාව තුළ මේ යෙදුම මුලින්ම භාවිත කරන ලද්දේ ප්‍රංශ ජාතික ප්‍රජාවිද්‍යාඥයෙකු වන Alfred Sauvy විසිනි (Greene, 1980).

**ISBN 978- 955-4563- 71- 1**

ලෝකය පළමුවැනි ලෝකය තරමටම කාර්මිකකරණය වූ කලාපයක් වුවත් ඒවා දෙවැනි ලොව රටවල් ලෙස සළකන ලද්දේ එකී රටවල් අනුගමන කළ දේශපාලන දර්ශනය සහ ආර්ථික ආකෘතිය නිසාය. 1980 දශකයේ අග භාගයේදී සෝවියට් සංගමය සහ නැගෙනහිර යුරෝපයේ කොමියුනිස්ට් රාජ්‍යයන් බිඳ වැටීමත් සමග මේ නාමෝද්දේශනය ක්‍රමයෙන් අහෝසි වී ගිය බව පෙනිණි.

1940 දශකයේ අග භාගයෙන් පසු සංවර්ධනය යන්න ගෝලීය මට්ටමින් අවධානයට ලක් වීමත් සමග සංවර්ධන මට්ටම පදනම් කරගත් ද්වීදෛවතාවය නිරූපණය කරන තවත් පාරිභාෂිත නාමෝද්දේශන ගණනාවක් භාවිතයට පැමිණියේය. සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් යන නාමෝද්දේශන යුගලනය මේ අතරින් වැදගත් වූවකි. අඩු සංවර්ධනයක් සහිත රටවල් හැඳින්වීම සඳහා භාවිත කරනු ලැබූ ඌන-සංවර්ධිත යන යෙදුමෙන් හැඟවෙන කිසියම් ආකාරයක නිශේධනීය අර්ථකථනය හෙවත් ඌන-සංවර්ධිත රටවල් යන්නෙන් අවම සංවර්ධන මට්ටමෙන් මිදිය නොහැකි හෙවත් ස්ථිතික තත්ත්වයන් ගම්‍ය වන්නේය යන අදහස වෙනුවට සංවර්ධනය වෙමින් පවතින රටවල් යන්නෙන් සංවර්ධන ක්‍රියාවලියේ ධනාත්මක ගතිකත්වයන් නිරූපණය වන්නේ යැයි සිතන ලදී. කෙසේ වෙතත් සමහර න්‍යායවාදීන්ට අනුව, විශේෂයෙන් සංවර්ධනය සම්බන්ධයෙන් 1950 ගණන්වල අග භාගයේ සිට විවේචනාත්මක අදහස් ඉදිරිපත් කළ නව මාක්ස්වාදී ගුරු කුලය පහළ සංවර්ධන මට්ටමක් සහිත ඌන-සංවර්ධිත රටවලට තමන් සිටින තත්ත්වයෙන් මිදීමට නොහැකිව ඇත්තේ ලෝක ආර්ථික අසාමාන්‍යතාවයන් එසේම පවතින නිසා යැයි තර්ක කළේය (Wills. 2005). ඒ නිසා ලෝක සංවර්ධන ද්වීදෛවතාවයන් පිළිබඳව සඳහන් කිරීමේදී සංවර්ධිත, ඌන-සංවර්ධිත යෙදුම තව දුරටත් භාවිත කිරීම ලෝක සංවර්ධනයේ යථා තත්ත්වය නිරූපණය කිරීමක් බව ඔවුන්ගේ අදහස විය. රටවල් අතර පවත්නා සංවර්ධන පසුබිම අනුව 1940 දශකයේ අග භාගයෙන් පසු ලෝකය මේ ආකාරයට පාරිභාෂික නාමකරණයකට ලක් වූවා සේම එම කාලයේ සිට දරිද්‍රතාවයෙන් සහ පසුගාමී සමාජ-ආර්ථික මට්ටමකින් යුක්ත වූ කලාපය සහ එම කලාපයේ ජනතාව සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීමේ ඔවුන් සමෘද්ධිමත් කිරීමේ අභිලාෂය ගවේෂණාත්මක සංකල්පයක් මෙන්ම නව ගැටලුකරණයටද විෂය ක්ෂේත්‍රයක් වූයේය. මේ අනුව ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු ලෝකයේ හඳුනාගත හැකි වූ ප්‍රධානතම ගැටලුව ලෙස දුගීභාවයට විසඳුම් සෙවීම 1940 අග භාගයෙන් පසු ඇරඹුණු සංවර්ධන යුගයේ ප්‍රධානතම අරමුණ විය. එක් අතකින් එය මානුෂික අරමුණක් ලෙස විස්තර කරනු ලැබීය. 1949 දී ඇමෙරිකානු ජනාධිපති හැරී ට්‍රූමන් ඉදිරි වර්ෂය සඳහා වූ ඇමරිකානු රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දී කළ පහත සඳහන් අදහස් සලකා බලන්න;

> *...ඉතිහාසයේ ප්‍රථම වරට මනුෂ්‍ය වර්ගයා මේ ජනතාවගේ දුක්ඛදෝමනස්සයන්ගෙන් සහනය සැලසීමට දැනුම සහ ශක්‍යතාවය හිමිව සිටී... වඩාත් හොඳ ජීවිතයක් අත්පත් කර ගැනීමට සඳහා ඔවුන්ගේ අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා ආධාර පිණිස සාමයට ලැදි ජනතාවට[3] අපගේ තාක්ෂණික දැනුම් සම්භාරයේ ප්‍රතිලාභ ලබා දිය යුතු යැයි මම විශ්වාශ කරමි...* (උපුටා ගැනීම Rist, 2002: 71).

මේ අනුව සංවර්ධනය යනු අත්‍යවශයෙන්ම ළඟා කරගත යුතු තත්ත්වයක් සේම ප්‍රත්‍යක්ෂ වශයෙන් ළඟා කරගත හැකි තත්ත්වයක් බව තහවුරු කරනු ලැබීය. ලෝකය පුරා සංවර්ධනය පැතිරවීමට ධනවත් රටවලට මූල්‍යමය සහ තාක්ෂණිකමය ශක්‍යතාවයක් ඇතැයි සඳහන් කරනු ලැබූ අතර සමෘද්ධිමත් රටවල ඉතිහාසය එය කළ හැකි දෙයක්ය යන්නට පැහැදිලි සාක්ෂියක් වූයේය. අවශ්‍ය වූයේ එම අරමුණ සැලසුම් කර ගැනීමයි. නැවත ගොඩනැගීම සහ සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව (*International Bank for Reconstruction and Development* ), එක්සත් ජාතීන්ගේ සංවිධානය (United Nations Organization), උතුරු ඇමරිකානු සහ යුරෝපීය විශ්වවිද්‍යාල, ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ආයතන හා පදනම් සහ සංවර්ධනය අපේක්ෂා කරන රටවල අග නගරවල පිහිට වූ සැලසුම් සකස් කිරීමේ ආයතනයන් 1940 දශකයේ අග භාගයෙන් අනතුරුව නිරන්තරයෙන් මේ කාර්ය සඳහා කැප විය. සංවර්ධනය අපේක්ෂා කරන රටවල් මුහුණ දෙන ගැටලු සහ අභියෝග හඳුනා ගැනීම, ඒවා න්‍යායකරණය සහ ඒ අනුව උචිත සංවර්ධන එළඹුමක් සකස් කරගැනීම මේ ආයතනයන්වල මූලික අරමුණ මෙන්ම අභියෝගයද වූයේය (Raply,2007, Morse,2004, Escobar, 1999, 1995).

1940 දශකයේ අගභාගයෙන් පසුව සංවර්ධනය මේ ආකාරයට පුළුල් අවධානයකට ලක් වූ ක්ෂේත්‍රයක් බවට පත් වූවා සේම එය බෙහෙවින් විවාද සම්පන්න විෂය ක්ෂේත්‍රයක් බවටද පත්විය. සැබවින්ම සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? දෙවන ලෝක යුද්ධයෙන් බිඳවැටුණු යුරෝපය

[3] කෙසේ වෙතත් හැරී ට්‍රූමන් මෙහිදී සාමයට ලැදි ජනතාව යනුවෙන් අදහස් කරන්නේ කොමියුනිස්ට්වාදී නොවන රටවල ජීවත්වන ජනතාවයි (Rist, 2002: 71).

**ISBN 978- 955-4563- 71- 1**

නැවත නගා සිටුවීමට අනුගමනය කළ සංවර්ධන උපාය මාර්ග ඒ ආකාරයෙන්ම ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු කලාපයට උචිත පොදු සංවර්ධන ප්‍රවේශයක් ලෙස අනුගමනය කළ හැකිද? සංවර්ධනය යන්න නිර්වචනය කිරීම සහ සංවර්ධනය මැනීම සම්බන්ධයෙන් පසුගිය දශක ගණනාව තුළ ගොඩනැගී ඇති විවාද සම්පන්න කතිකාව පිළිබඳව අවධානය යොමු කිරීමෙන් මේ බව පැහැදිලි වනු ඇත.

## III කොටසඃ සංවර්ධනය සංකල්පීයව නිර්වචනය කිරීම සහ සංවර්ධනය මැනීම

ඇලන් තෝමස් (Alan Thomas) ට අනුව, "සංවර්ධනය" න්‍යායාත්මක සහ දේශපාලනික ද්විආංශිකවම විවාදිත වූ සහ නෛසර්ගිකව සංකීර්ණ සහ උභයාර්ථවාචී සංකල්පයකි... මෑත කාලයේදී, විශේෂයෙන්ම දරිද්‍රතාවය පිටු දැකීම සහ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක සංවර්ධන නියෝජිත ආයතනයන් නිසා එය සීමාසහිත අර්ථයක් ගෙන තිබේ (Thomas, 2004ඃ 1-2. උපුටා ගැනීම Summer and Tribe, 2008). කෙසේ වෙතත් නූතන සංවර්ධන යුගය ආරම්භ වූ මුල් කාලයේදී බොහෝ දෙනෙකු සංවර්ධනය යන්න ''නවීනත්වය" (Modernity) යන සංකල්පය සමග සම්බන්ධ කර විග්‍රහ කර ඇති බව හඳුනාගත හැකිය. පුළුල් අර්ථයෙන් නවීනත්වය යනු නව්‍ය වීම, වර්තමානය සමග සම්බන්ධ වීම වැනි අරුත් ගෙන දෙයි. නවීනත්වය යන්න යුරෝපා පුනරුද සමයේ, එනම් 17 වන සියවසේ සහ 18 වන සියවසේ යුරෝපයේ, විශේෂයෙන්ම බටහිර යුරෝපා සමාජයේ, ආර්ථිකය හා සමාජය ආශ්‍රිතව සිදුවූ වෙනස්කම් හා සම්බන්ධය. යුරෝපයේ දී, ආර්ථිකමය දෘෂ්ටිකෝණයෙන් නවීනත්වය යන්නෙන් කාර්මීකරණය, නාගරීකකරණය සහ ආර්ථිකයේ සියලුම ක්ෂේත්‍රයන්වලදී තාක්ෂණය භාවිතා කිරීමේ වැඩිවීම අදහස් විය. මේ තාක්ෂණික සහ විද්‍යාත්මක මූල ධර්මයන් සමාජීය හා සංස්කෘතිකමය ක්ෂේත්‍රවලද නිරූපණය විය. 17 වැනි සහ 18 වැනි සියවස්වල බටහිර යුරෝපයේ පුනරුද යුගය සමග සිදුවූ දෙය නම් ලෝකය සහ ප්‍රගතිය අවබෝධ කර ගැනීම සඳහා තාර්කික සහ විද්‍යාත්මක එළඹුම් භාවිතා කිරීමේ වැදගත්කම වැඩිවීමයි. මේ තත්ත්වය එයට පෙර පැවති ආගමික ඉගැන්වීම් මත සමාජය අවබෝධකර ගැනීමේ ආකෘතියට වඩා හාත්පසින්ම වෙනස් වූවකි. මේ වෙනස්වීම වෛද්‍ය ක්‍රම, නීතිය හා දේශපාලනය වැනි ක්ෂේත්‍ර හා සම්බන්ධ එළඹුම් වෙනස් වීමටද බලපෑවේය (Willis, 2005: 3-4) "නවීනත්වය" සංකල්පය හා බැඳුණු ඓතිහාසික තත්ත්වය එසේ වූයේ නම්, 1940 දශකයේ අගභාගයෙන් පසු "සංවර්ධනය" යන්න "නවීනත්වය" යන සංකල්පයට අදාළව නිර්වචනය වූයේ කෙසේද? ඇන්ඩි සමර් සහ මිචෙල් ට්‍රයිබ් (Andy Summer and Michael Tribe) 1950 ගණන්වල සිට ගොඩනැගුණු සංවර්ධනය පිළිබඳ සංකල්පකරණයේ ස්වරූප තුනක් හඳුනා ගනී. පළමුවැන්න, 1950 සහ 1960 ගණන්වල බෙහෙවින් ප්‍රචලිත වූ "සංවර්ධනය යනු ව්‍යුහාත්මක සමාජ පරිණාමයකි" යන දෘෂ්ටියයි. දෙවැන්න, (දරිද්‍රතාවය අවම කිරීම ඇතුළු කාර්ය සිද්ධීන් සහ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ළඟා කරගැනීම වැනි) ප්‍රතිපත්ති හා සම්බන්ධිත සහ ඇගයුම් හා නිර්ණායකයන් පදනම් කරගත් සංවර්ධනය පිළිබඳ උපදෙස් සහ ආධාර සපයන නියෝජිත ආයතනයන් විසින් පෝෂිත කෙටිකාලීන සහ මධ්‍යකාලීන ක්ෂිතිජයන් සහිත වූවකි. වඩාත් මෑත කාලීනව ගොඩනැගී ඇති තුන් වැනි දෘෂ්ටිකෝණය මානව-කේන්ද්‍රණවාදී සංකල්පවේද මත පදනම්වූ සංවර්ධනය බටහිර අධිපතිවාදී සංකල්පකරණයකිය යනුවෙන් පශ්චාත්-නූතනවාදීන් ගොඩනගන පර්යාලෝකයයි (Summer and Tribe, 2008: 11). මෙතැන් සිට මේ ලිපිය මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ සංවර්ධනය පිළිබඳ මෙම සංකල්පීය පර්යාලෝකයන් පිළිබඳ සැකෙවින් සලකා බැලීමට සහ 1940 දශකයේ අග භාගයෙන් පසු සංවර්ධනය යන්න විද්වත් ශාස්ත්‍රීය ශික්ෂාවන් හා කතිකාවන් අතර සහ සංවර්ධන ක්‍රියාධරයින් අතර නිර්වචනය වී ඇත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් සලකා බැලීමටය.

### "සංවර්ධනය යනු ව්‍යුහාත්මක සමාජ පරිණාමයකි"

සංවර්ධන සංකල්පකරණය පිළිබඳ ඇන්ඩි සමර් සහ මිචෙල් ට්‍රයිබ්ගේ වර්ගීකරණයේ පළමුවැන්න 1950 සහ 1960 ගණන්වල බෙහෙවින් ප්‍රචලිත වූ "සංවර්ධනය යනු ව්‍යුහාත්මක සමාජ පරිණාමයකි" ය යන්නයි. ඩේවිඩ් ලෙවිස් සහ කැති ගා(ර්)ඩ්නර් (David Lewis and Kathy Gardner) යන මානව විද්‍යාඥයන් මෙකල මේ දෘෂ්ටියට අනුව "සංවර්ධනය" නිර්වචනය වූ අයුරු පහත සඳහන් පරිදි පෙන්වා දෙති; "උතුර දියුණු ලෙසත් දකුණු ස්ථිතික සාම්ප්‍රදායිකත්වය තුළ සිර වූ එහෙත් මෙම තත්ත්වය තාක්ෂණය සහ නිෂ්පාදනය පිළිබඳ ධනේෂ්වර සම්බධතා ජාලය තුළින් පමණක් වෙනස් කළ හැකිය යැයි පෙන්වා දෙනු ලබන ප්‍රගතිය සහ වෙනස්වීම පිළිබඳ තත්ත්වය සංවර්ධනයයි" (Lewis and Gardner, 1996ඃ ). මේ දෘෂ්ටිය ස්වරූප දෙකකින් යුක්තය. පළමු ස්වරූපයට අනුව, 1940 දශකයේ අග භාගයේදී නූතන සංවර්ධනය යුගය ආරම්භ වීමත් සමග "සංවර්ධනය" යනු "නවීනත්වය" යන

**ISBN 978- 955-4563- 71- 1**

අදහස ආර්ථික විද්‍යාත්මක අනුදේශනයක් යටතේ යුරෝපා කේන්ද්‍රණවාදී ස්වරූපයකින් නිර්වචනය වූවකි. අනෙක් ස්වරූපය සංවර්ධනය පිළිබඳ නවීකරණ න්‍යායන් (Modernization Theories) ඇසුරෙන් හඳුනාගත හැකිය.

"සංවර්ධනය" යනු "නවීනත්වයයි" යන අදහස ආර්ථික විද්‍යාත්මක අනුදේශනයක් යටතේ යුරෝපා කේන්ද්‍රනවාදී ස්වරූපයකින් නිර්වචනය කිරීමේදී ''සංවර්ධනය වන රටක් හෝ ප්‍රදේශයක් යනු උතුරු ඇමෙරිකාවේ හෝ බටහිර යුරෝපයේ ආර්ථික මට්ටමට ළඟා නොවූ රටක් හෝ ප්‍රදේශයක්" බව 1987 තරම් මෑත කාලයේදී පවා ඇතැම් ශබ්දකෝෂගත නිර්වචනයක සඳහන් විය (**Petty-Robert Dictionary**, උපුටා ගැනීම, Rist, 2002: 8). සංවර්ධනය පිළිබඳ කතිකාව ආරම්භවූ යුගයේදී ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතන විසින් ද, ගෝලීය උතුරේ සහ ගෝලීය දකුණේ රටවල් (එනම් සංවර්ධනය අපේක්ෂා කළ රටවල්) විසින් ද මේ යුරෝපා කේන්ද්‍රීය ආර්ථික විද්‍යාත්මක අනුදේශනය බොහෝ විට පිළිගනු ලැබිණි. මේ අනුව රටක ආර්ථික නිමැවුම වැඩි කිරීමෙන් එම රටේ සංවර්ධනයක් ඇති කළ හැකිය යන අදහසත්, ආර්ථික නිමැවුම වැඩි කිරීම සඳහා ආයෝජන වැඩි කිරීමත් අපේක්ෂා කරන ලදී. මේ අදහසට අනුව රටක සංවර්ධන මට්ටම සලකා බැලීමේදී ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදනය (Gross National Product Per Capita - GNP) නැත්නම් දළ ජාතික ආදායමේ (Grooss Nationa Income - GNI) වැඩිවීම සලකා බලන ලදී. ක්‍රමානුකූලව වැඩිවන ජාතික ආදායම සහ ඒක ශීර්ෂ දළ ජාතික ආදායම සංවර්ධනය මැනීමේ නිර්ණායක වූයේය. ආර්ථික වර්ධන ක්‍රියාවලියත් සමග ප්‍රාථමික භාණ්ඩ නිෂ්පාදනය සහ යැපුම් කෘෂිකර්මාන්තය නිෂ්පාදන කර්මාන්ත හෝ සේවා කටයුතු බවට පරිවර්තනය වන ආර්ථික ව්‍යුහයේ වෙනස් වීමක් ඇතිවන බව විශ්වාස කෙරිණි. ආර්ථික වෘද්ධියත් සමග සෞඛ්‍ය තත්ත්වය, අධ්‍යාපන මට්ටම සහ ජීවිතයේ ගුණාත්මක භාවය ද ඉහළ යන බව සිතන ලදී (Sant'Ana, 2008: 5). ඩබ්. ඩබ්. රොස්ටොව් (W.W. Rostow) විසින් 1960 දී ප්‍රකාශයට පත් කළ ආර්ථික වර්ධනයේ අවධි (The Stage of Economic Growth) නමැති සුප්‍රකට න්‍යායාත්මක ලියවිල්ල තුළ මේ අදහස ගැබ්ව තිබුණි. සංවර්ධනය යනු ආර්ථික වෘද්ධියයි, සහ ආර්ථික නිමැවුම වැඩි කිරීමෙන් රටක් සංවර්ධනය කළ හැකිය යන මේ අදහසට අනුබලය ලැබුණේ දෙවන ලෝක යුද්ධයෙන් බිඳ වැටුණු යුරෝපය මාර්ෂල් ආධාර වැඩසටහන (Marshal Plan) යටතේ කෙටි කලකින් නැවත ගොඩනැගීමෙන් ලද අත්දැකීමයි.

නවීනත්වය සමග බැඳුණු 1950 සහ 1960 ගණන්වල බෙහෙවින් ප්‍රචලිත වූ "සංවර්ධනය යනු ව්‍යුහාත්මක සමාජ පරිණාමයකි" යන යුරෝපා කේන්ද්‍රනවාදී සංකල්පයමය දෘෂ්ටියේ අනෙක් ස්වරූපය සංවර්ධනය පිළිබඳ නවීකරණ න්‍යායන් (Modernization Theories) ඇසුරෙන් හඳුනාගත හැකි විය. මාක්ස්වාදි නොවන, සාර්ව සමාජවිද්‍යාත්මක සහ අන්තර්-විෂයික න්‍යායක් වශයෙන් මෙම න්‍යායාත්මක පර්යාලෝකමය සුසමාදර්ශය මුලදී සංස්කෘතිය සහ ප්‍රගතිය (ආර්ථික වෘද්ධිය) අතර හා පසුව ආර්ථික වෘද්ධිය සහ ප්‍රජාතන්ත්‍රවාදය අතරත් සම්බන්ධය කෙරෙහි අවධානය යොමු කරමින් දෘෂ්ටිවාදමය වශයෙන් සහ ඓතිහාසික වශයෙන් සමාජයන්ගේ දියුණුව සංකල්පගත කිරීමට උත්සාහ දරා ඇත. මේ අනුව, නවීකරණ න්‍යාය නවීන ප්‍රගතිය කේන්ද්‍රීය රටවල් විසින්ද සම්ප්‍රදායික පසුගාමීත්වය පර්යන්තයීය ප්‍රදේශයන් විසින්ද නියෝජනය කරන්නාවූ ගෝලීය ක්‍රමයකට ලෝකය භූගෝලීය වශයෙන් සම්බන්ධ කරන ලදී. එසේම, කේන්ද්‍රීය රටවල් විසින් පර්යන්තීය ප්‍රදේශයන්ට ඔවුන්ගේ අනාගතය පෙන්වන බවද  නවීකරණ න්‍යායයේ මූලික තර්කයකි. මේ අනුව 1950 ගණන්වල සිට බටහිර, විශේෂයෙන්ම ඇමරිකානු සමාජ විද්‍යාඥයින්, සමාජ මනෝවිද්‍යාඥයින්, දේශපාලන සමාජ විද්‍යාඥයෝ සංවර්ධනය යන්න ආර්ථික වෘද්ධියක් වශයෙන් පමණක් නොව සංවර්ධනය වන රටවල පවුල් ආකෘතීන්, ආකල්ප සහ මානසික තත්ත්වයන්, සංස්කෘතිය, ප්‍රජා විද්‍යාත්මක පසුබිම, දේශපාලනය යන ව්‍යුහාත්මක ක්ෂේත්‍රවල සිදුවන වෙනස්කම් මෙන්ම ජාතිය ගොඩනැගීම, ග්‍රාමීය සමාජය නවීකරණය වීම සහ නාගරීකරණ ක්‍රියාවලිය යන අංශයන්ට ද අදාළ වන්නාවූ වෙනස්කම් සහිත සමාජ නවීකරණ එළඹුම් ඉදිරිපත් කළහ. එවැනි න්‍යායාත්මක සුසමාදර්ශීය එළඹුම් ඉදිරිපත් කල අය අතර; ඩැනියෙල් ලර්නර් (Daniel  Lerner), නීල්. ජේ. ස්මෙල්සර් (Neil J. Smelser), ඩේවිඩ් සී. මැක්ලෙලන්ඩ් (David C. Meclellend), ගේබ්‍රියෙල් ආ(ල්)මොන්ඩ් සහ සිඩ්නි වර්බා (Gabriel Almond and Sidney Verba), සැමුවෙල් හන්ටින්ග්ටන් (Samuel Huntington), ඩේවිඩ් ඇප්ටර් (David Apter), එස්. එන්. අයිසන්ඩට් (S. N. Etsentadt), ඇලෙක්ස් ඉන්කෙල්ස් සහ ඩේවිඩ් එච්. ස්මිත් (Alex Inkeles and David H. Smith) යන අය ප්‍රධාන තැනක් ගනී. මේ අය විසින් අනුදත් සමාජ නවීකරණ එළඹුම් ආශ්‍රිතව සිදුවන්නාවූ ව්‍යුහාත්මක සමාජ පරිණාමය ඩීන් සී. ටිප්ස් (Dean C. Tipps) සංක්ෂිප්ත කරන්නේ පහත සඳහන් පරිදිය;

නවීකරණය එවිට පරිවර්තනයක් බවට පත්වේ, නැත්නම් ප්‍රාථමික යැපුම් අර්ථ ක්‍රමයක සිට තාක්ෂණ සූක්ෂම කාර්මික ආර්ථිකයන්; යටත් තත්ත්වයේ සිට සහභාගීත්ව දේශපාලන සංස්කෘතීන් බවට; වැසුණු ශිලාකෘත තත්ත්ව පද්ධතියක සිට සාධිත ප්‍රතිඵල ළඟාකර ගත හැකි ක්‍රමයට; විස්තෘත පවුල් ක්‍රමයක සිට න්‍යෂ්ටික

**ISBN 978- 955-4563- 71- 1**

ශුද්ධත්ව ඒකකයන්ට; ආගමිකත්වයේ සිට ලෝකායත්ත (ඓහික) දෘෂ්ටිවාදයන්ට යනාදී වශයෙන් වූ පරිවර්තන මාලාවක් බවට පත්වේ (Tipps, 1973: 204).

කෙසේ වෙතත් සංවර්ධනය යනු ආර්ථික වෘද්ධියක් යැයිද, ඒ අනුව සංවර්ධනය මැනීමේදී ආර්ථිකමය නිර්ණායකවලට ප්‍රමුඛත්වය දුන් සංවර්ධනය පිළිබඳ යුරෝපා කේන්ද්‍රීය ආර්ථික විද්‍යාත්මක අනුදේශනය මෙන්ම සමාජයන්ගේ දියුණුව ව්‍යුහාත්මත වෙනසක් ලෙස දෘෂ්ටිවාදමය වශයෙන් සහ ඓතිහාසික වශයෙන් සංකල්පගත කිරීමට උත්සාහ කළ නවීකරණ න්‍යායවාදීන්ගේ නිර්වචනමය පර්යාලෝකයන්ද දැඩි ලෙස විවේචනයට ලක්විය. මේ විවේචන මූලික කරුණු කීපයක් වටා ගොනු වී තිබුණි. පශ්චාත් යුධ සමය තුළ දළ ජාතික ආදායමේ ආකර්ශණීය වැඩිවීම නිසා සෞඛ්‍ය තත්ත්වය, අධ්‍යාපන මට්ටම සහ ජීවිතයේ ගුණාත්මක භාවය ඇතුළුව ජනතාවගේ ජීවන තත්වයේ සැලකිය යුතු වෙනසක් නැත්නම් වර්ධනයක් සැම විටම සිදුවූයේ නැත. අමාර්ත්‍යා සෙන්ට අනුව 1980 දශකයේදී පවා පහළ ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදනයක් සහිත එහෙත් ඉහළ ජීවිතාපේක්ෂාවක් පෙන්නුම් කළ චීනය සහ ශ්‍රී ලංකාව සමග සාපේක්ෂ කරද්දී ඉහළ ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදනයක් පෙන්නුම් කළ දකුණු අප්‍රිකාව, මෙක්සිකෝව වැනි රටක උපතේදී අපේක්ෂිත ජීවිතාපේක්ෂාව පෙන්නුම් කළේ සැලකිය යුතු පහළ මට්ටමකි (Sen, 1988: 12-3). අවකාශීය වශයෙන් සංවර්ධනය ප්‍රතිලාභ ගලායාමේ අසාමාන්‍යතාවයන් මෙන්ම ඒක පුද්ගල ආදායම සංවර්ධනය මැනීමේ නිර්ණායකය ලෙස යොදා ගැනීමේ දුර්වලතාද මෙහිදී අවධානයට ලක් විය. (Szimari, 2005: 17). උදාහරණයක් ලෙස, ඛණිජ තෙල් නිෂ්පාදනය කරන මැදපෙරදිග රටවල් ගත්විට 1960-70 කාලයේදී පවා ලෝකයේ ඉහළම ඒක පුද්ගල ආදයමක් එම රටවල් විසින් පෙන්නුම් කළ ද එම රටවල ආදායම් බෙදී යාමේ බරපතල විෂමතාවයක් තිබුණේ ඛණිජ තෙල් ආදායම් ජනගහනයේ එක් කොටසකට පමණක් සීමා වූ නිසාය. සංවර්ධනය යනු ව්‍යුහාත්මක සමාජ පරිණාමයකි යන යුරෝපා කේන්ද්‍රීය සංකල්පයමය දෘෂ්ටිය, විශෙෂයෙන්ම සමාජයන්ගේ දියුණුව ව්‍යුහාත්මත වෙනසක් ලෙස දෘෂ්ටිවාදමය වශයෙන් සහ ඓතිහාසික වශයෙන් සංකල්පගත කිරීමට උත්සාහ කළ නවීකරණ න්‍යායවාදීන්ගේ නිර්වචනමය පර්යාලෝකයන් දැඩි ලෙස විවේචනයට ලක් වූයේ 1960 ගණන්වල සිට ලතින් ඇමරිකානු කලාපය කේන්ද්‍ර කොටගෙන මතු වූ "නව-මාක්ස්වාදි ගුරු කුලයෙනි" (Neo- Marxist School). 1960 ගණන්වල මුල් කාලයේ සිට 1970 දශකයේ අවසන් කාලය දක්වා මුලින් ලතින් ඇමරිකානු කලාපයේත් පසුව ආසියා සහ අප්‍රිකානු කලාපයේත් සංවර්ධනය සහ ඌන-සංවර්ධනය ක්‍රියාවලිය විශ්ලේෂණ කළ " පරාධීන න්‍යාය" (Depedency Theory) සහ "ලෝක පද්ධතික න්‍යාය" (World System Theory) විසින් තර්ක කළ ආකාරයට, ඌන-සංවර්ධිත රටවල හඳුනාගත හැකි ඌන-සංවර්ධනය එකී රටවලට අතීත කාලයේ ලැබුණු බාහිර බලපෑම්වල ප්‍රතිඵලයක් වන්නා සේම එම ආකෘතිය දිගින් දිගටම එම රටවල ක්‍රියාත්මක වන්නේ බාහිර බලපෑම් තවදුරටත් නව ස්වරූපයකින් (නව-යටත් විජිතවාදය - Neo-colomialism) ක්‍රියාත්මක වන නිසාය. දේශපාලනික නිදහස ලැබීම නිසා පරාධීනත්වය අවසන් නොවේ. පශ්චාත් යටත් විජිත යුගය තුළ ඌන-සංවර්ධිත රටවල ආර්ථික ව්‍යුහය බාහිරින් එන නව-යටත් විජිත බලවේගවල තීරණාත්මක බලපෑම් අනුව තීරණය වේ ( Szirmai, 2005). මේ අනුව, ප්‍රගතිය, සංවර්ධනය සහ කාර්මිකකරණය වෙත ළඟාවීම සඳහා ඇති එකම ඉඩ ප්‍රස්ථාව ගෝලීය පරාධීන ජාල සම්බන්ධතාවයන් සහිත ධනේෂ්වර අන්තර්ජාතික ආර්ථික සංවිධානයෙන් ඉවත් වි විකල්පීය සංවර්ධන ආකෘතියක් වෙත යොමු වීම බව නව-මාක්ස්වාදි ගුරු කුලයේ මූලික තර්කනය විය.

**ප්‍රතිපත්ති, ඇගයුම් හා නිර්ණායක පදනම් වූ සංවර්ධන සංකල්පකරණය**

සංවර්ධනය යනු ඓතිහාසිකව බටහිර ලෝකයේ සිදුවූ ආකාරයේ ව්‍යුහාත්මක සමාජ වෙනස්වීමක්ය යන යුරෝ-කේන්ද්‍රීය සංකල්පමය සුසමාදර්ශීය නිර්වචනයන්ගේ සීමාන්තික බව, ඒ අනුව සංවර්ධනය මැනීමේදී මතුවූ ගැටලු සහ ඒ අනුව සංවර්ධනය පිළිබඳ යුරෝ-කේන්ද්‍රීය සංකල්පමය සුසමාදර්ශයට එල්ල වූ විවේචන සමර් සහ ට්‍රයිබ් (Summer and Tribe, 2008) පෙන්වා දෙන සංවර්ධනය පිළිබඳ සංකල්පකරණයේ දෙවන එළඹුම, එනම් කෙටිකාලීන සහ මධ්‍යකාලීන ක්ෂිතිජයන් සහිත ප්‍රතිපත්ති, ඇගයුම් සහ නිර්ණායක පදනම් කරගත් සංවර්ධන සංකල්පකරණයක් බිහිවීම කෙරෙහි සැලකිය යුතු මට්ටමකින් බලපෑවේය. ප්‍රගතිශීලි වෙනස්වීමේ දෘෂ්ටියක් නැත්නම් මානයක් ලෙස ඇලන් තෝමස් (2000, 2004) මේ එළඹුම දකින අතර චාර්ල්ස් ගෝර් (Charles Gore) එය කාර්ය සාධන ඇගයීමක් ලෙස හඳුනා ගනී (2000: 794). මේ අනුව, නිර්වචනමය වශයෙන් මේ දෙවන එළඹුම දැඩි තාක්ෂණිකමය එළඹුමක් ලෙසද තර්ක කළ හැක්කේ කෙටි කාලීනව හෝ මධ්‍ය කාලීනව සිදුවන සන්සන්දනය කළ හැකි සහ මැනිය හැකි වෙනස්කම් (උදාහරණයක් ලෙස දුගීභාවයේ හෝ ආදායම් මට්ටමේ වෙනසවීම්...) සහිත කාර්ය සාධක දර්ශකයන්, අරමුණු හෝ ඉලක්ක පිළිබඳව එය අවධානය යොමු කරන නිසාය (Summer and Tribe, 2008). මේ එළඹුම ආශ්‍රිතව සංවර්ධන නියෝජිත ආයතනයන්

**ISBN 978- 955-4563- 71- 1**

විසින් සංවර්ධනය විග්‍රහ කිරීම වඩාත් ප්‍රචලිත වන්නේ 1980 ගණන්වල සිට වුවත් 1960 ගණන්වල සිටම එවැනි විග්‍රහයන් සංවර්ධනය කතිකාව තුළ තිබූ බව බ්‍රිතාන්‍ය ආර්ථික විද්‍යාඥයෙකු වන ඩඩ්ලි සියර්ස් (Dudly Seers) සංවර්ධනය පිළිබඳ දක්වන අදහස්වලින් පැහැදිලි වේ.

සංවර්ධනය යන්න ආර්ථික වෘද්ධියකට වඩා වැඩි දෙයක් විය යුතුය සහ සංවර්ධනය නිර්වචනය කිරීමේදී සහ මැනීමේදී ආර්ථික නිර්ණායක භාවිතා කිරීමේ ගැටලුව 1960 ගණන්වලදී පුළුල් ලෙස සාකච්ඡාවට ලක් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඩඩ්ලි සියර්ස් රටක සංවර්ධනය විග්‍රහ කිරීමේදී ආර්ථික වෘද්ධිය යන්නට අමතරව ඇසිය යුතු ප්‍රශ්න තුනක් පෙන්වා දෙයි. එනම් එම රටේ දුගීභාවයට සහ මන්දපෝෂණයට සිදු වී ඇත්තේ කුමක්ද? ආදායම් විෂමතාවයට සිදු වී ඇත්තේ කුමක්ද? සහ විරැකියාවට සිදු වී ඇත්තේ කුමක්ද? යන ප්‍රශ්නයි. රටක ආර්ථික වෘද්ධියට සාපේක්ෂව මේ ක්ෂේත්‍ර තුන ඉහළ මට්ටමක සිට පහළ මට්ටමකට පැමිණ ඇත්නම් එම රට සංවර්ධනය වෙමින් පවතින බවට සැකයක් නැත. එහෙත් එම ගැටලු එසේම තිබියදී ආර්ථික වෘද්ධිය, එසේත් නැත්නම් ඒක ශීර්ෂ දළ ජාතික ආදායම කොතරම් ඉහළ මට්ටමකට පැමිණියත් එම රටේ සංවර්ධනයක් සිදුව ඇතැයි කිව නොහැකි බව සියර්ස් සඳහන් කරයි (Seers, 1969: 5). සියර්ස්ගේ මෙම විග්‍රහය සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න විග්‍රහ කිරීමේ දී බෙහෙවින් අවධානයට ලක් වූ අතර ඒ අනුව 1970 පසුව සංවර්ධනය යන්න මිනුම් කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් නිර්ණායකවලට සියර්ස්ගේ මූලික තර්කයන් ඇතුළත් විය. විශේෂයෙන්ම 1970 දශකයේදී සංවර්ධනය පිළිබඳ උපදෙස් සහ ආධාර සපයන නියෝජිත ආයතනයන්, සංවර්ධනය වන ලෝකයේ ආණ්ඩු සහ එකී ආයතන හා ආණ්ඩුවල සංවර්ධන ප්‍රතිපත්ති දුප්පත්ම ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සැපයීම (Basic need approach) සඳහා අවධානය යොමු කළ යුතුය යන අදහසට පැමිණීමට සියර්ස්ගේ ඉහත විග්‍රහය ඉවහල් විය. මේ අනුව 1976 දී ජාත්‍යන්තර කම්කරු සංවිධානය (International Labour organization) විසින් මූලික අවශ්‍යතා යන්න අංශ 04 ක් යටතේ නිර්වචනය කරන ලදී. එනම්, පුද්ගල පැවැත්මට අවශ්‍ය වන්නා වූ මූලික දේවල්; එනම්, ආහාර, වාසස්ථාන, ඇඳුම් පැළඳුම්; අත්‍යවශ්‍ය සේවාවන් සඳහා යොමුවීම: පිරිසිදු ජලය, සනීපාරක්ෂාව, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවාවන්; වැටුප් වෘත්තීන් සඳහා යොමුවීම; සහ ගුණාත්මක අවශ්‍යතාවයන්: ගුණාත්මක සහ ආරක්ෂිත පරිසරය, තීන්දු තීරණ ගැනීම සඳහා සහභාගී වීමට ඇති හැකියාවයි (උපුටා ගැනීම Wills, 2005: 93-4). මේ අනුව 1970 දශකය වන විට සංවර්ධනය මැනීමේ දී ද ආර්ථිකමය නිර්ණායකයන්ට අමතරව මානව ජීවිතයේ ගුණාත්මක තත්ත්වය සඳහා දක්වන නිර්ණායකයන් කෙරෙහි අවධානය යොමුවීමක් හඳුනාගත හැකිය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1970 දශකයේ මැද භාගයේදී විදේශීය සංවර්ධන කවුන්සිලය (Oversis Development Council) නැමැති ආයතනය වෙනුවෙන් මොරිස් ඩේවිඩ් මොරිස් (Morris David Morris) විසින් රටක සංවර්ධනය මැනීමේ මිනුමක් වශයෙන් භෞතික ජීවන තත්ත්ව දර්ශකය (Physical Quality of Life Index: PQLI) නැමැති මිනුමක් හඳුන්වා දෙනු ලැබීය. මෙයට අයත් වූයේ සාක්ෂරතාවය (Literacy), උපතේදී අපේක්ෂිත ආයු කාලය (Life expectancy) සහ ළදරු මරණ අනුපාතිකය (Infan mortality rate) යන සාධකයන්ය (Morris, 1979). එහෙත් මෙම නිර්ණායක පවා සංවර්ධනය යන්න නිර්වචනය කිරීමේදී සහ මැනීමේදී කොතරම් දුරට නිවැරදි ආකාරයෙන් භාවිතා කළ හැකිය ද යන ගැටලුව එම නිර්ණායකය හඳුන්වා දුන් කාලයේදී ම ඇති විය. උදාහරණයක් ලෙස PQLI දර්ශකය හඳුන්වා දුන් 1970 දශකයේ මැදභාගය වන විට ශ්‍රී ලංකාවේ එම දර්ශකයේ මට්ටම ඇතැම් සංවර්ධිත රටවල මට්ටමට ආසන්නව පැවතිණි.[4] එසේම දකුණු ඉන්දියානු ප්‍රාන්තයක් වන කේරළයේද භෞතික ජීවන තත්ත්ව දර්ශකයේ මට්ටම ඉහළ මට්ටමකින් හඳුනාගත හැකි විය. මේ අවස්ථා දෙකේදීම ඉහළ භෞතික ජීවන තත්ත්ව අගයක් නිරූපණය වීමට හේතුව රාජ්‍ය මැදිහත් වීම යටතේ ක්‍රියාත්මක වූ සුභසාධන සේවාවන්ගේ බලපෑමයි. එහෙත් එවැනි ඉහළ භෞතික ජීවන තත්ත්ව මට්ටමක් ශ්‍රී ලංකාවේ එම කාලය වන විට තිබුණේ වී නමුදු එකල ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් ලෙස නොසැළකිණි. මෙලෙස ඉන්දියානු කේරළ ප්‍රාන්තයේද භෞතික ජීවන තත්ත්ව දර්ශකය ඉහළ මට්ටමකි තිබුණත් සමස්ත ඉන්දියාවේ එම දර්ශකයේ මට්ටම පහළ අගයකින් යුක්ත විය (Sen: 1988). මේ අනුව සංවර්ධනය යන්න මැනීමේ ද PQLI දර්ශකය යොදා ගැනීමේ යම් යම් සීමාවන් තිබුණේය යන්න පැහැදිලිය.

කෙසේ වෙතත්, ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයන් විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති, ඇගයුම් සහ නිර්ණායකයන් පදනම් කරගත් සංවර්ධන සංකල්පකරණමය එළඹුම් 1980 දශකයේදී වඩාත් ඉදිරියට පැමිණේ. මෙම එළඹුම්වලදී ජනතාවට සංවර්ධන ක්‍රියාවලියට දායක වීමට ඇති ඉඩකඩ

---

4 ශ්‍රී ලංකාව 2005 වසරේදී පවා PQLI දර්ශකයේ 43 වන ස්ථානයේ රැඳී සිටියේය. බලන්න http://social.rollins.edu/wiki/population/index.php/Physical_Quality_of_Life_Index.

**ISBN 978- 955-4563- 71- 1**

සහ සංවර්ධනයේ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඇති හිමිකම මෙන්ම සංවර්ධන ක්‍රියාවලියේදී පරිසරය ආරක්ෂා කිරීම සහ පරිසරයට දරා ගත හැකි සංවර්ධනයක් අත්පත් කර ගැනීම යනාදි ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමුවේ. මේ සඳහා බලපෑ වැදගත් අවස්ථා දෙකක් කෙරෙහි මෙහිදී අවධානය යොමු කළ යුතුය. මෙයින් **පළමුවැන්න** 1982 එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේදී ලෝකයේ ජාතීන් විසින් ඇති කරගත් එකගතාවය අනුව **"පරිසරය සහ සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසම"** (World Commission on Environment and Development – WCED)[5] ස්ථාපිත වීමයි. 1987 දී එම කොමිසම විසින් **"අපේ පොදු අනාගතය"** (Our Common Future) මැයෙන් ඉදිරිපත් කළ වාර්තාවෙන් මානව ක්‍රියාකාරකම් හේතු කොට ගෙන වායුගෝලීය දූෂණය, ජල මූලාශ්‍ර දූෂණය, වනගහනය විනාශ වීම, භූගත ජලමට්ටම පහත වැටීම, සත්ව විශේෂ විනාශ වීම, භූමියේ සාරවත් භාවය පහත වැටීම, කාන්තාරකරණය, අම්ල/ඇසිඩ් වැසි ඇති වීම, ඕසෝන් ස්ථරය විනාශ වීම ඇතුළුව ලෝකයේ ස්වභාවික පරිසරයට අත්ව ඇති භයානක සහ දුක්ඛදායක තත්ත්ව පෙන්වා දුන් අතර සංවර්ධන ක්‍රියාවලියේදී අනාගත පරම්පරාවට ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට ඇති හැකියාව අවධානයට ලක් නොකර සහ මිනිසා ජීවත් වන පරිසරය විනාශ නොකොට වර්තමාන අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ අනිවාර්ය වගකීමද අවධාරණය කරන ලද්දේය (WCED, 1987). **දෙවැන්න**, නූතන සංවර්ධන යුගයේදී සංවර්ධන යන්න සංවර්ධන ක්‍රියාවලියට හසුවන රටවල් සහ එම රටවල ජනතාවගෙන් පිටස්තරව නිර්වචනය වන්නාවූ සහ සැලසුම් කරන්නාවූ දෙයක්ය යන අදහස සංවර්ධනය වෙමින් පවතින ලෝකය තුළ වැඩි වැඩියෙන් සමාජගත වීම හේතු කොට ගෙන 1980 ගණන් වන විට එකී ලෝකය තුළින්ම සංවර්ධනය පිළිබඳ විකල්පීය මතවාදයන් ගොඩනැගීමයි. ඒ අනුව, 1981 දී "**මානව සහ ජනතා අයිතීන් පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය**" (African Charter on Human and Peoples' Right) විසින් "**සංවර්ධනය වීමට ඇති අයිතිය**" (Right to Development – RTD) නියත, ප්‍රත්‍යෙක සහ සාමූහික අයිතියක් ලෙස ප්‍රකාශයට පත් කළ අතර "**මානව අයිතීන් පිළිබඳ අරාබියානු ප්‍රඥප්තිය**" (Arab Charter on Human Rights) ඇතුළුව බොහෝ ස්ථානවලදී එය ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් විය. "**සංවර්ධනය වීමට ඇති අයිතිය**" මූලික මානව අයිතිවාසිකමක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගනු ලැබ 1986 දී "**එක්සත් ජාතීන්ගේ සංවර්ධනය වීමට ඇති අයිතිය පිළිබඳ ප්‍රකාශනය**" (United Nations Declaration on the Right to Development) තුළ පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් විය.

*සියලුම මානව අයිතිවාසිකම් සහ මූලික ස්වතන්ත්‍රතාවය පූර්ණ වශයෙන් ඉෂ්ට කරගත හැකි වන්නා වූ සමාජ, ආර්ථික දේශපාලනික සංවර්ධනය භුක්ති විඳීමට, ඊට දායක වීමට සහ එයට සහභාගීවීමට සදාචාරාත්මක වශයෙන් සෑම මිනිසෙක් ම හා සියලුම ජනතාව හිමිකම් ලබන්නා වූ සංවර්ධනය වීමට ඇති අයිතිය අහිමි කළ නොහැකි මානව අයිතිවාසිකමකි* (United Nations, 2013: 498).

1980 දශකයේ අගභාගය වන විට ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයන් විසින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති, ඇගයුම් සහ නිර්ණායකයන් පදනම් කරගත් සංවර්ධන සංකල්පකරණයන්ට ඉහත පිළිගැනීම සැලකිය යුතු බලපෑමක් සිදු කළ බව හඳුනාගත හැකිය. මේ සම්බන්දයෙන් දිය හැකි හොඳම උදාහරණය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (United Nation Development Program - UNDP) විසින් 1980 දශකයේ අවසාන කාලයේ ඉදිරිපත් කරන ලද මානව සංවර්ධන දර්ශකයයි (Human Development Index - HDI). පාරිසරික විද්‍යාව, තිරසර සංවර්ධනය, සුභසාධන ආර්ථික විද්‍යාව, ස්ත්‍රීවාදය වැනි සංකල්පවලින් පෝෂණය වී ඇති "මානව සංවර්ධනය" (Human Development) පිළිබඳ සංකල්පය සංවර්ධනයේ හුදු ආර්ථික වර්ධනය පිළිබඳ දෘෂ්ටිය සහ ප්‍රතිමානික දේශපාලනය පිළිබඳ දෘෂ්ටිය වෙනුවට ආර්ථිකයන් තුළ මානව ප්‍රාග්ධනයේ සමස්ත වටිනාකම තෝරා ගැනීමට සමාජ ප්‍රාග්ධනය සහ ආයතනික ප්‍රාග්ධනය යෙදවිය හැක්කේ කෙසේද යන්න පිළිබඳ අවධානය යොමු කරයි. සංවර්ධනයේ පරමාර්ථයක් ලෙස "මානව ශක්‍යතාවයන් වර්ධනය" පිළිබඳ අදහස් ඉදිරිපත් කළ අමාර්ත්‍යා සෙන් (Amartya Sen), සහ "ජනතාවගේ තෝරා ගැනීම්වලට ඇති ඉඩකඩ වැඩිවීම" පිළිබඳ අදහස් ඉදිරිපත් කළ මහමුද් උල්හක් (Mahabub-ul-Haq) වැනි විද්වතුන්ගේ දායකත්වයද "මානව සංවර්ධනය" පිළිබඳ අදහස වර්ධනය වීමට බෙහෙවින් බලපෑ අතර මේ අනුව " මානව සංවර්ධනය" යන අදහස **එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන** (United Nations

[5] මෙම කොමිසම එහි සභාපතිත්වය දැරූ හිටපු ස්වීඩන අගමැතිවරියක් වූ **ග්‍රෝ හාර්ලෙම් බ්‍රන්ට්ලන්ඩ්** (Gro Harlem Brunthend) නිසා **බ්‍රන්ට්ලන්ඩ් කොමිසම** නමින්ද ප්‍රසිද්ධියට පත් විය.

ISBN 978- 955-4563- 71- 1

Development Program - UNDP) විසින් පිළිගනු ලැබ සංවර්ධනය මැනීමේ දර්ශකයක් ලෙස "**මානව සංවර්ධන දර්ශකය**" පිළිගැණිනි.

"**මානව සංවර්ධන දර්ශකය**" තුළ ආර්ථිකමය නිර්ණායකයන් සමඟ පුද්ගල ජීවිතයේ ගුණාත්මක බව නිර්ණය කරන මානයන් තුනකි; **දිගු කාලීන හා සෞඛ්‍ය සම්පන්න ජීවිතය**, **අධ්‍යාපනය හා දැනුම** සහ **ශිෂ්ට සම්පන්න පැවැත්ම** යනු ඒවාය. මේ නිර්ණායකයන් තුන මගින් කිසියම් රටක සෞඛ්‍ය අංශයේ ගුණාත්මක වර්ධනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව සහ ගෞරවණීය සමාජ ජීවිතයක් ගත කිරීමට පුද්ගලයාට ඇති හැකියාව නිරූපණය වන්නේ යැයි උපකල්පනය කොට ඒ අනුව එකී නිර්ණායක මත රටක සංවර්ධන මට්ටම නිර්ණය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන උත්සාහ කොට ඇති බව හඳුනාගත හැකිය. පසු කාලයේදී ඉහත ක්ෂේත්‍රයන්ට අමතරව දේශපාලන නිදහස සහ මානුෂීය අයිතිවාසිකම්, පාරිසරික යහපැවැත්ම සහ එවැනි පරිසරයක ජීවත් වීමට ඇති ඉඩකඩ, දේශපාලන තීරණ ගැනීම සඳහා ජනතාවට සහභාගී වීමට ඇති ඉඩකඩ යනාදිය ද ඊට එක්විය යුතු බව පිළිගැණිනි. මේ අනුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන විසින් 1991 දී ප්‍රකාශයට පත් කෙරුණු මානව සංවර්ධන වාර්තාවේ "මානව සංවර්ධනය" යන්න නිර්වචනය කරන ලද්දේ පහත සඳහන් පරිදිය;

*මානව සංවර්ධනයේ මූලික අරමුන වන්නේ සංවර්ධනය වඩාත් ප්‍රජාතාන්ත්‍රික සහ සහභාගී බවට පත්කිරීම සඳහා ජනතාවගේ තෝරාගැනීමේ පරාසය පුළුල් කිරීමයි. ආදායම් සහ රැකියා අවස්ථා, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පිරිසිදු සහ ආරක්ෂිත භෞතික පරිසරයකි සඳහා වූ ප්‍රවේශය එකී තෝරා ගැනීම්වලට ඇතුළත් විය යුතුය. එක් එක් පුද්ගලයාට ප්‍රජා තීරණවලට පූර්ණ සහභාගීවීමට සහ මානව ආර්ථික සහ දේශපාලන නිදහස භුක්ති විඳීමට ද අවස්ථාව තිබිය යුතුය* (Human Development Report – UNDP, 1991)

මේ අනුව සංවර්ධනය නිර්ණය කිරීමේදී සහ ඒ අනුව සංවර්ධනය මැනීමේදී කාලයක් තිස්සේ ඉහළ ඒක පුද්ගල ආදායමක් හිමි වූ රටවල් උදාහරණයක් ලෙස මැදපෙරදිග තෙල් සම්පත් බහුල රටවල් මානව සංවර්ධන දර්ශකය තුළ පහළ මානව සංවර්ධන අගයක් පෙන්නුම් කළේය. එයට හේතුව මානව සංවර්ධන දර්ශකය තුල සංවර්ධනයේ සමාජීය දර්ශකයන් ලෙස සලකන සාක්ෂරතාවය, ආදායම් බෙදීයාමේ විෂමතාවය සැලකිය යුතු මට්ටමකින් එම රටවල පැවතීමයි. කෙසේ වෙතත් මේ දර්ශකයට අනුව දිගු කාලයක් තිස්සේ පහළ ඒක පුද්ගල ආදායමක් හිමිව සිටි එහෙත් හොඳ සමාජ සංවර්ධන මට්ටමක් වූ කියුබාව, ශ්‍රී ලංකාව වැනි රටවල මානව සංවර්ධන මට්ටම ඉහළ අගයක් පෙන්නුම් කළේය.

නූතන සංවර්ධන යුගයේදී සංවර්ධනය පිළිබඳ උපදෙස් සහ ආධාර සපයන නියෝජිත ආයතනයන් විසින් පෝෂිත කෙටිකාලීන සහ මධ්‍යකාලීන ක්ෂිතිජයන් සහිත කාර්යසිද්ධි සහ අභිමතාර්ථ ළඟා කරගැනීම අරමුණු කරගත් ප්‍රතිපත්ති හා සම්බන්ධිත සහ ඇගයුම් සහ නිර්ණායකයන් පදනම් කරගත් සංවර්ධන සංකල්පකරණමය එළඹුම් කූටප්‍රාප්තියට අවස්ථාව වූයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2000 දී "**සහශ්‍ර සංවර්ධන අරමුණු**" (Millennium Development Goals - MGDs) ඉදිරිපත් කෙරුණු අවස්ථාවයි. සහශ්‍ර සංවර්ධන අරමුණු යනු 2000 වසරේ සැප්තැම්බර් මාසයේ පැවැත්වූ එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සම්මන්ත්‍රණයේදී ලෝකයේ ජාතීන් 189 ක්, ලෝක නායකයින් 147 ක් විසින් පිළිගනු ලැබූ සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් සහ 2015 වන විට අත්පත් කරගැනීමට අපේක්ෂිත සංවර්ධනය පිළිබඳ ඉලක්කයන්ය. එක්සත් ජාතීන් විසින් මෙවැනි සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් සහ ඉලක්ක අඩංගු වැඩ පිළිවෙළක් පිළිගනු ලැබීමට බලපෑවේ 1990 දශකය තුළදී ගෝලීය වශයෙන් හඳුනාගත් ආර්ථික, සමාජීය හා සංස්කෘතික, දේශපාලනික සහ පාරිසරික ගැටලු සහ අභියෝගයන්ය. මේ අනුව සහශ්‍ර සංවර්ධන අරමුණු තුළ ගෝලීය වශයෙන් හඳුනාගත් එකී ගැටලු සහ අභියෝගයන් ජය ගැනීම උදෙසා 2015 වර්ෂය වන විට සාධනය කරගත යුතු ප්‍රධාන අරමුණු 08 ක් හඳුන්වා දෙන ලදී. ඒ පහත සඳහන් පරිදිය;

1. අන්ත දුගී බව සහ කුසගින්න/සාගතය මුලිනුපුටා දැමීම
2. විශ්වීය ප්‍රාථමික අධ්‍යාපනය ළඟාකර ගැනීම
3. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වැඩි දියුණු කිරීම සහ කාන්තාවන් බල ගැන්වීම
4. ළදරු මර්ත්‍යතාවය පහළ දැමීම
5. මාතෘ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම
6. ඒඩ්ස් (එච්.අයි.වී.), මැලේරියා සහ වෙනත් රෝගවලට එරෙහිව සටන් කිරීම
7. පාරිසරික තිරසාරත්වය සුරක්ෂිත කිරීම
8. සංවර්ධනය සඳහා වූ ගෝලීය සහසම්බන්ධතාවය/හවුල්කාරත්වය වර්ධනය කිරීම (United Nations, 2015).

ISBN 978- 955-4563- 71- 1

මේ ප්‍රධාන අරමුණු 08 හා බැඳුණු ඉලක්ක 18 ක් සහ එකී අරමුණු සහ ඉලක්ක ඇගයීම සඳහා දර්ශක 48 ක්ද අඩංගු වීමෙන් ඇන්ඩි සමර් සහ මිචෙල් ට්‍රයිබ් (2008) ගේ සංවර්ධනය පිළිබඳ සංකල්පකරණයේ දෙවැනි ස්වරූපය කොතරම් දුරට ප්‍රවර්තනීය (durational) ප්‍රතිපත්ති, ඇගයුම් සහ නිර්ණායකයන් පදනම් කොට ගෙන ඇත්දැයි පැහැදිලි වේ. ඇත්තෙන්ම 2000 වසරේ සැප්තැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගනු ලැබුවේ 1980 සහ 1990 දශකවල අන්තර්ජාතික වශයෙන් විවිධ සම්මේලනවලදී ප්‍රතිපත්ති සම්පාදකයන්, සැලසුම්කරුවන්, දේශපාලන නායකයන් සහ සංවර්ධනය හා සම්බන්ධව සෘජුව කටයුතු කරන ශාස්ත්‍රඥයන් විසින් ගෝලීය සංවර්ධන ක්‍රියාවලිය තුළ සැලකිල්ලට ගත යුතු යැයි සහ සිදුවිය යුතු යැයි අවධාරණය කර තිබූ අරමුණු සමුදායකි. 1940 දශකයේ අගභාගයේ දී සංවර්ධන යුගය ආරම්භ වී ගෝලීය වශයෙන් සංවර්ධන ක්‍රියාකාරකම් ව්‍යාප්ත වුවත් විසඳාගත නොහැකි වූ ඌන-සංවර්ධනය හා බැඳුණු මූලික ගැටලු ගණනාවක් සහ ඌන-සංවර්ධිත බව නිසා සහ සංවර්ධිත අරමුණු ඉටුකර ගැනීමේදී ගෝලීය පරිසරයට සිදුවන බලපෑම මෙන්ම සංවර්ධන ක්‍රියාවලියේදී ගෝලීය එකඟතාවයක අවශ්‍යතාවය සහශ්‍ර සංවර්ධන අරමුණුවලින් අවධාරණය විය. විශේෂයෙන්ම, අනාගතයේදී මුහුණ දීමට සිදුවන සංවර්ධනය හා බැඳුණු අභියෝගවලට ලෝකයේ සියලුම ජාතීන් එකඟතාවකින් යුතුව මුහුණ දී එකී අභියෝග ජය ගැනීම මෙහිදී විශේෂයෙන්ම අවධාරණය වී තිබේ.

**සංවර්ධනය පිළිබඳ පශ්චාත්-නූතනවාදී පර්යාලෝකය**

ඇන්ඩි සමර් සහ මිචෙල් ට්‍රයිබ් (Summer and Tribe, 2008) හඳුනා ගන්නා සංවර්ධනය පිළිබඳ සංකල්පකරණයේ තුන් වැනි දෘෂ්ටි කෝණය, එනම් මානව-කේන්ද්‍රණවාදී සංකල්පවේද මත පදනම්වූ සංවර්ධනය යන්න බටහිර අධිපතිවාදී සංකල්පකරණයක් යැයි පශ්චාත්-නූතනවාදීන් විසින් ගොඩනගන ලද අදහස 1990 දශකයේ සිට සංවර්ධනය පිළිබඳ කතිකාව තුළ විශේෂ ස්ථානයක් අත්පත් කරගෙන ඇත. 1950 ගණන්වල අග භාගයේදී සංවර්ධනය හා ඌන-සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදායික ධනේෂ්වර න්‍යායකරණයට රැඩිකල් විකල්පයක් ලෙස ශාස්ත්‍රීය ලෝකය තුල බෙහෙවින් ජනප්‍රියත්වයට පත් නව-මාක්ස්වාදි ගුරු කුලය විසින් ඉදිරිපත් කරන ලද්දේද මෙවැනි අදහසකැයි ද, ඒ නිසාම සංවර්ධනය පිළිබඳ පශ්චාත්-නූතනවාදීන්ගේ මේ අදහස්වල නව්‍යතාවයක් නැතැයි කෙනෙකුට තර්ක කළ හැකිය. බැලූ බැල්මට එය එසේ යැයි පෙනී ගියද, යම් යම් සමානකම් තිබුණද, සංවර්ධනය පිළිබඳ මාක්ස්වාදි ගුරු කුලයේ අදහස් සහ පශ්චාත්-නූතනවාදීන්ගේ අදහස් අතර දෘෂ්ටිමය වශයෙන් සහ ක්‍රමවේදීය වශයෙන් සැලකිය යුතු වෙනස්කම් රැසක් ඇත. මේ අනුව, මේ ලිපියේ ඊළඟ කොටසේදී සංවර්ධනය පිළිබඳ පශ්චාත්-නූතනවාදීන්ගේ සංකල්පමය එළඹුම පිළිබඳව අවධානය යොමු කෙරේ.

1980 දශකයේ අගභාගයේ සිට කරලියට පැමිණි පශ්චාත්-සංවර්ධන කතිකාව නූතන සංවර්ධන න්‍යායකරණය සහ භාවිතය පිළිබඳ ශාස්ත්‍රීය ලෝකයේ අතෘප්තිමත්භාවය පිළිබිඹු කරනවා සේම ඒ අනුව එකී සංවර්ධන න්‍යායකරණය සහ භාවිතාව ප්‍රතික්ෂේප කළ යුතුය යනුවෙන් මතවාදයක්ද ගොඩනගයි. පශ්චාත්-සංවර්ධන කතිකාවට දායක වන බොහෝ දෙනෙක් භාෂාව, දැනුම සහ සිතීම විසින් උත්පාදනය කරන බලය පිළිබඳව අදහස් පළ කළ 20 වන සියවසේ ප්‍රකට ප්‍රංශ දාර්ශනිකයෙකු වන මිචෙල් ෆුකෝ(ල්ට්) (Michel Foucault, 1966; 1969) ගේ චින්තනමය සන්දර්භයේ ආභාසය ලබා ඇති බව පෙනී යයි. ඒ අනුව ඔවුන් සංවර්ධනය යන්න දකින්නේ එයින් අරමුණු වන පරමාර්ථය නියම කරන සහ නිර්මාණය කරන දේශනාවක් ලෙසය (Nustad, 2001: 480). දෙවන ලෝක යුද්ධයෙන් පසු සංවර්ධනය යන සංකල්පය සහ භාවිතය ලෝකය මත උතුරේ ආධිපත්‍ය පැතිර වීමේ පිළිබිඹුවක්ය යන්න ඔවුන්ගේ තර්කයයි (Willis, 2005: 28). ආසියානු, අප්‍රිකානු සහ ලතින් ඇමරිකානු රටවල කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයන් සහ දෙවන ලෝක යුද්ධයෙන් පසු ගොඩනැගුණු සංවර්ධන දෘෂ්ටීන් හා සම්බන්ධ ලිපි ලේඛන ඇසුරු කරගෙන විග්‍රහවල යෙදෙන පශ්චාත්-සංවර්ධන කතිකාවේ ලේඛනයන් පෙන්වා දෙන්නේ දුප්පත් යැයි හඳුනාගනු ලැබූ ඉහත ප්‍රදේශවවල හඳුනගත හැකි ගැටලු විසඳීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කළ නූතන සංවර්ධන දෘෂ්ටිවාදය සහ භාවිතය ලෝකයේ විශාල ප්‍රදේශයක් ගෝලීය උතුර කේන්ද්‍ර කරගත් ආර්ථික දේශපාලන පරිසරයකට නතු කර ගැනීමට උපකාර කර ඇති බවයි. පශ්චාත්-සංවර්ධන කතිකාවේ ප්‍රමුඛ ලේඛකයන්, විශේෂයෙන්ම ආර්තුරෝ එස්කෝබා(ර්) (Arturo Escobar), වොල්ෆැන්ග් සැච්ස් (Wolfang Sachs) වැනි අය දෙවන ලෝක යුද්ධයෙන් පසු දශකවල ක්‍රියාත්මක වූ සංවර්ධන දෘෂ්ටිය සහ භාවිතයන් යටත් විජිතවාදයේ සෘජු අවි ලෙස දකී (උපුටා ගැනීම Nustad, 2001: 480). සැච්ස් තවදුරටත් පෙන්වා දී ඇති පරිදි දෙවන ලෝක යුද්ධයෙන් පසු සංවර්ධනය පිළිබඳ අදහස් දැක්වූ නවීකරණ න්‍යායවාදීහු (Moderniztion Therorists) සෙසු ලෝකයේ සියලු දෙනා

**ISBN 978- 955-4563- 71- 1**

විසින්ම එක්සත් ජනපදය අනුගමනය කළ යුතු බවට ආදර්ශයක් ගොඩනැගුවෝය (Sachs, 1992: 1). ගුස්ටාවෝ එස්ටේවා (Esteva, 1992) පෙන්වා දෙන ආකාරයට ඌන-සංවර්ධනය පිළිබඳ අදහස බටහිර න්‍යායවාදීන් විසින් ගොඩනගන ලද්දකි. මේ අනුව, නූතන සංවර්ධන යුගය ඇරඹීමත් සමඟ ලෝකයේ බහුතර ජන සමූහයක් තවදුරටත් විවිධ ජනවාර්ගික සමූහයන් ලෙස නොව ඌන-සංවර්ධිත වශයෙන් ඔවුන්ගේ තත්ත්වය අනුලක්ෂණය කොට සජාතිය වර්ගයකට ඇතුළු කරන ලද්දේය.

ඉහත පශ්චාත්-සංවර්ධන කතිකාව හා සැසඳෙන අදහසක් ප්ලෝරීඩා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු වන නේපාල ජාතික නන්දා ෂ්‍රේෂ්තා (Nanda Shrestha) සිය නේපාලයානු අත්දැකීම් ඇසුරෙන් ඉදිරිපත් කරයි. නන්දා ෂ්‍රේෂ්තා ඇමෙරිකානු විශ්වවිද්‍යාලයක මහාචාර්යවරයෙකු වුවද ඔහු 1940-50 දශකවල මධ්‍යම නේපාලයේ පොකාරා (Pokhara) නම් ප්‍රදේශයේ මත්පැන් නිෂ්පාදනය සඳහා භාවිතා කරන ධාන්‍ය වගා කළ යැපුම් කෘෂි-ආර්ථික පසුබිමකින් යුක්ත පවුලක හැදී වැඩුනෙකි. ඔහු ජීවත් වූ නිවසද ප්‍රදේශයට ආවේණික වූ අනික් නිවාස මෙන් වර්ෂාවෙන් තෙත-හරිත වන කුඩා නිවෙසකි. සංවර්ධනය පිළිබඳ නූතන දෘෂ්ටිය අනුව නම් එකී පසුබිම පසුගාමී, ඌන-සංවර්ධිත තත්ත්වයකි. එහෙත් නන්දා ෂ්‍රේෂ්තා පෙන්වා දෙන පරිදි එම පරිසරයේ ජීවත් වූවන්ට එම පසුබිම පිළිබඳව වූ සංවේදනය ඊට වඩා හාත්පසින්ම වෙනස්ය.

*... එම ප්‍රදේශයේ ජීවත් වූවන්ට දුප්පත්කම සාමාන්‍ය තත්ත්වයක් වූ අතර ඔවුන්ට එය සමාජ නිර්මිතයක් ලෙස නොපෙනිණි. එසේම එය තර්ජනාත්මක තත්ත්වයක් ලෙස නොසලකන ලද්දේය. ඔවුන් දුප්පත් වූ නමුදු තමන් ඌන-සංවර්ධිත යැයි ද ඒ නිසාම තමන් මානුෂීය ගරුත්වයෙන් පහළ මට්ටමේ සිටින්නේ යැයි ද කිසිවකු සිතුවේ නැත...* (උපුටා ගැනීම Willis, 2005).

කෙසේ වෙතත් 1950 දශකයේ මුලභාගයේ සිට බටහිර ආධාර සහිත සංවර්ධන යෝජනා ක්‍රම නේපාලයේ ඇරඹිණි. මේ සමඟ නේපාල ජනතාවට තමන් එතෙක් ගත කළ ජීවිතය පසුගාමී තත්ත්වයක් ලෙසත්, සංවර්ධන සංක්ලපය විසින් හඳුන්වා දෙන ලද නවීනත්වය පරමාදර්ශී ළඟා කරගත යුතු තත්ත්වය ලෙස විග්‍රහ කරගත් ආකාරයත් නන්දා ෂ්‍රේෂ්තා පෙන්වා දෙයි. හඳුන්වා දුන් නව සංවර්ධන සංකල්පයට සාපේක්ෂව සලකා බලද්දී තමන් එතෙක් අනුගමනය කළ ජීවිතය හා සම්බන්ද සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම, ශ්‍රම-සූක්ෂම නිශ්පාදන ක්‍රම, භාෂාව, අධ්‍යාපනය පසුගාමී තත්ත්වයන් ලෙස ඔවුන් විසින් සලකන ලදී. සාගින්න සහ දුගීභාවය තවදුරටත් පැවතුණද, ස්වයං විශ්වාසය හා ස්වාධීනත්වය නැතිවී ගියද; සංවර්ධනය ළඟා කරගත හැකි තත්ත්වක් ලෙස සැලකීමට නේපාල ජනතාව පෙළඹිණි. ස්වදේශීය නේපාලයානු සංස්කෘතිය හා ජීවන රටාව වෙනුවට යුරෝපීයානු සහ ඇමෙරිකානු පරමාදර්ශයන්, සංස්කෘතිය සහ අදහස් උසස් යැයි නිරූපණය කළ මේ ක්‍රියාවලිය යටත්විජිතකරණයේ රටාවක් ලෙස නන්දා ෂ්‍රෙස්තා පෙන්වා දෙයි (උපුටා ගැනීම, Willis, 2005: 29).

ආර්තුරෝ එස්කෝබා(ර්) (Arthuro Escobar) පශ්චාත්-සංවර්ධන කතිකාව තුළ නූතන සංවර්ධන දෘෂ්ටිවාදය සහ භාවිතයන් සම්බන්ධයෙන් බෙහෙවින් විවේචනාත්මක අදහස් ඉදිරිපත් කර ඇත්තෙකි. මිචෙල් ෆුකෝ(ල්ට්)ගේ චින්තනයෙන් බෙහෙවින් ආභාසය ලැබූ එස්කෝබා(ර්) කොලොම්බියාවේ (Colombia) කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයන ඇසුරෙන් පෙන්වා දෙන්නේ නූතන සංවර්ධන දෘෂ්ටිවාදය නිර්මාණය කිරීම බටහිර නවීනත්වය පිළිබඳ ඉතිහාසය හා සම්බන්ධ වන බවයි. එස්කෝබා(ර්)ට අනුව;

1. සංවර්ධනය ලෝක බැංකුව, එක්සත් ජනපද රජය, සහ අනිකුත් උතුරේ ආයතනයන් විසින් දෙවන ලෝක යුද්ධයෙන් පසු කුලවද්දන ලද (adopted) බෙහෙවින් තාක්ෂණික වූ එළඹුමකි.
2. ආගන්තුකයන්/පිටස්තරයන් පැමිණීමට පෙර දුප්පත්කම වැනි දෙයක් කොලොම්බියාවේ නොවූ අතර ඒ නිසාම සංවර්ධනයක්ද අවශ්‍ය නොවීය.
3. කොලොම්බියානු සමාජයට සහ ආර්ථිකයට බාහිර ප්‍රතිමාණයන් සහ අපේක්ෂාවන් එක් කිරීමෙන් රට සංවර්ධනයේ ඌනතාවයකින් පෙළෙන්නේ යැයි තේරුම් කරනු ලැබිණි.
4. එකී සංවර්ධන ඌනතාවය උතුරේ සංවර්ධනය ආකෘතිය අනුවගමනය කිරීමෙන් පමණක් විසඳාගත හැකි යැයි සලකනු ලැබූ අතර ඒ අනුව විවිධාකාරයේ ආධාර යෝජනා ක්‍රම සහ තාක්ෂණික ආධාරයන් සපයනු ලැබිණි (උපුටා ගැනීම, Willis, 2005: 28).

මෙවැනි පසුබිමක් යටතේ නූතන සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමේ විශේෂිත උපාය මාර්ග තුනක් එස්කෝබා(ර්) හඳුනා ගනී.

1. විශේෂිත මැදිහත් වීමකින් පිළියම් කළ යුතු අසාමාන්‍ය තත්ත්වයක් ලෙස දුප්පත් රටවල ගැටලු සංයුක්තකරණය කිරීමෙන් බලය සඳහා මැදිහත් වීමට ඉඩ ලැබීම.

ISBN 978- 955-4563- 71- 1

මේ දෘෂ්ටිකෝණයෙන් සංවර්ධනය යන්න දුප්පත් රටවලට දැනුම පිළිබඳ බලය ව්‍යාප්ත කිරීමකි. මේ අනුව දෙවන ලෝක යුද්ධයෙන් පසු දුප්පත් යැයි කියූ රටවල දුගීභාවය, සාම්ප්‍රදායික සහ අකාර්යක්‍ෂම නිෂ්පාදන තාක්‍ෂණය සහ ප්‍රාග්ධනය, ශීඝ්‍ර ජනගහන වර්ධන වේගය, ප්‍රමාණවත් නොවන පොදු සේවාවන්, සාම්ප්‍රදායික කෘෂි-ආර්ථිකය යනාදි සියල්ල නිර්වචනය කරන ලද්දේ බටහිර සංවර්ධන ආකල්පවලට ගැළපෙන පරිද්දෙන් සහ ඒ අනුව එම ක්ෂේත්‍රයන්වලට මැදහත්වීමට සංවර්ධිත යැයි තියූ බලවත් ජාතීන්ට ඉඩ ලැබෙන පරිද්දෙනි. මේ නව දැනුම දුගී රටවල සමාජ-ආර්ථික ප්‍රශ්න පිළිබඳව කරන ලද පර්යේෂණ මත දැඩි ලෙස විශ්වාසය තබන අතර ඒ ඔස්සේ සම්පාදනය කරන ලද දැනුම එතෙක් එම රටවල් පිළිබඳව තිබූ දැනුමට වඩා වෙනස්ය. මේ නව දැනුම ඔස්සේ බටහිර නොවන රටවල් විසින් එසේ නොවන රටවල පුද්ගලයින්, ආණ්ඩු සහ ප්‍රජාව දුප්පත් යැයි නිර්ණය කළ අතර දුප්පත් රටවල දුගීබව නැති කිරීමට සඳහා වූ බලවත් යාන්ත්‍රණයක් ලෙස සංවර්ධන දෘෂ්ටිවාදමය භාවිතාව ක්‍රියාත්මක වේ.

2. දුගී රටවල පවතින තත්ත්වය සංවර්ධනයට උචිත ලෙස සකස් කිරීම සඳහා සංවර්ධනය පිළිබඳ විශේෂඥයන් සහභාගී වීම සහ ඒ අනුව සංවර්ධනය වෘත්තීයකරණය වීම.

නූතන සංවර්ධන යුගය ඇරඹීමත් සමඟ දුගී රටවල දුගී බවට අදාළ යැයි අනුමාන කළ සියලු දේවල් සහ එකී රටවල සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික, ප්‍රජා විද්‍යාත්මක පසුබිම (ගෘහය, පුද්ගලයා, කෘෂි-ආර්ථිකය, කර්මාන්ත, යටිතල පහසුකම්, ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ, පරිසරය, සෞඛ්‍යය, අධ්‍යාපනය....) සංවර්ධන පිළිබඳ විශේෂඥයන්ගේ (සංවර්ධන ආර්ථික විද්‍යාඥයන්, ප්‍රජා විද්‍යාඥයන්, කෘෂි විද්‍යාඥයන්, සෞඛ්‍යය හා පෝෂණ විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන්.....) සැලසුම්කරුවන්ගේ, උපදේශකයන්ගේ තීක්‍ෂණ නෙත්වලින් විශ්ලේෂණය වූයේ දුගී රටවල සමස්ත සංවර්ධන ක්‍රියාවලිය දැනුම පිළිබඳ දේශපාලනයේ සහ බටහිර විද්‍යාත්මක ඥානයෙන් පෝෂණය වූ ඉහත සඳහන් කළ ආකාරයේ වෘත්තිය සංවර්ධන විශේෂඥයන්ගේ ග්‍රහණයට දුගී රටවල් යටත් කරමිනි. එස්කෝබා(ර්) පෙන්වා දෙන ආකාරයට තුන් වන ලෝකයට සංවර්ධන විශේෂඥයන් පැමිණියේ 1944 දී මිත්‍ර පාර්ශ්වික ජාතීන් ප්‍රංශයේ නෝ(ර්)මැන්ඩි වෙරළ (Normandy beach in France) තීරයට එක්වර ඉතා විශාල හමුදා සේනාංකයක් ගොඩබැස්සවූ පරිද්දෙනි.[6] සංවර්ධනය පිළිබඳ මෙකී විශේෂඥයන් වෘත්තීයවේදීන් ලෙස සිය විෂය ක්ෂේත්‍රයන් තුළ දුගී රටවල ගැටලු විශ්ලේෂණය කර සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමට සඳහා උපදෙස් ලබා දුන්නේ සංවර්ධන දෘෂ්ටිවාදය සහ භාවිතය දෙවන ලෝක යුද්ධයෙන් පසු බිහි වූ සුවිශේෂී වෘත්තීමය ක්ෂේත්‍රයක් බවට පත් කරමින් සහ එම වෘත්තීයවේදීන්ගේ දැනුම පිළිබඳ බලය දුගී රටවල් වෙත යොදවමිනි.

03. සංවර්ධනය අයතනගත වීම සහ ඒ අනුව තෙවන ලොව රටවල ජනතාවගේ නිශ්චිත හැසිරීම් සහ ආබාධකරණය කළ දැනුම පිළිබඳ බලයේ නව ආයතනික ජාලයන් නිර්මාණය වීම.

සංවර්ධන වෘත්තීයකරණය වීම සමඟම සංවර්ධන කතිකාව ආයතනික පරිසරයන් තුළ නිෂ්පාදනය කොට, සටහන් කොට, තහවුරු කොට, විකරණය කොට සංසරණය කරන ලදී. දුගී/තෙවන ලෝකයේ රටවල ගැටලු හඳුනා ගැනීම සඳහා වූ මධ්‍යස්ථාන, විශ්වවිද්‍යාලවල සංවර්ධන අධ්‍යයන මධ්‍යස්ථාන සහ ප්‍රාදේශිය අධ්‍යයනයන් සඳහා වූ වැඩසටහන්, අන්තර් ජාතික සංවිධාන, ජාතික සැලසුම් කාර්යංශයන් සහ ප්‍රාදේශීය සංවර්ධන කාර්යංශයන්, ප්‍රජා සංවර්ධන කමිටු, පෞද්ගලික ස්වේච්ඡා සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුලු සංවර්ධනය, සැලසුම්කරණය, උපදේශනය, ආධාර සැපයීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආයතන හරහා 1940 දශකයේ අගභාගයේ සිට තෙවන ලෝකයේ රටවල සමස්ත සංවර්ධන ක්‍රියාවලිය ආයතනගත වූයේ සහ ඒ ඔස්සේ ක්‍රියාකාරී වූයේ දැනුම පිළිබඳ දේශපාලනය සහ බලයට තෙවන ලොව රටවල ජනතාව යටත් කරමිනි. මේ ආයතනික ජාලයේ ක්‍රියාත්මක තත්ත්වය හරහා තෙවන ලොව රටවල පුද්ගලයන්, ආණ්ඩු සහ ප්‍රජාව විශේෂිත සමාජ-ආර්ථික සංවර්ධන චක්‍රයකට බැඳුණු අතර එම ප්‍රජාව අපේක්ෂිත සංවර්ධන ඉලක්ක කරා ගෙන යාම

---

6 □නෝ(ර්)මැන්ඩි ගොඩ බැසීම" යනු දෙවන ලෝක යුද්ධයේදී ජර්මානු නාසි හමුදාවේ ග්‍රහණයට යටත්ව තිබූ වයඹදිග යුරෝපය නිදහස් කරගැනීම සඳහා 1944 ජූනි 06 වැනිදා මිත්‍ර පාක්ෂික ජාතීන් විසින් ආරම්භ කළ යුධ මෙහෙයුමයි. මෙහෙයුමේ අරමුණ වූයේ නාසීන්ට සිතා ගත නොහැකි මොහොතක, සිතා ගත නොහැකි තරම් විශාල ප්‍රමාණයක් සොල්දාදුවන් පිරිසක් ඉංග්‍රීසි ඕඩය (English Channel) ඔස්සේ නෝ(ර්)මැන්ඩි වෙරල තීරයට ගොඩ බැස්සවීමෙන් ඔවුන් අන්දමන්ද කොට නාසි ග්‍රහණයෙන් වයඹදිග යුරෝපය නිදහස් කරගැනීමයි. මේ මෙහෙයුම සඳහා ප්‍රහාරක සහ ගොඩ බැසීමේ යාත්‍රා 5000 ක්, පරිවාර යාත්‍රා 289 ක්, මුහුදු වෙඩි ඉවත් කිරීමේ යාත්‍රා 277 ක්ද සහභාගි විය. මධ්‍යම රාත්‍රියේදි බ්‍රිතාන්‍ය, ඇමෙරිකානු සහ කැනේඩියානු ගුවන් ප්‍රහාර සමග ගුවන් භටයින් 24,000 ක් ගොඩ බස්වා ප්‍රහාර දියත් කළ අතර අතර, පලමු දිනයේදී (1944 ජූනි 06) යුධ භටයින් 160,000 ක්ද, ජූනි මාසය අවසානය වන විට 875,000 ක්ද යුධ භටයින් නෝ(ර්)මැන්ඩි වෙරළ තීරයට ගොඩ බැස තිබුණි. බ්‍රිතාන්‍ය, ඇමෙරිකාව සහ කැනඩාව ඇතුළු රටවල් 13 ක් සහභාගි වූ මෙම මෙහෙයුම මානව ඉතිහාසයේ සිදු කරන ලද විශාලතම නාවික මෙහෙයුම ලෙස වාර්තා වේ (*https://en.wikipedia.org/wiki/**Normandy**_landings*).

ISBN 978- 955-4563- 71- 1

> සඳහා වූ නිශ්චිත හැසිරීම්වලට සහ සහේතුකත්වයකට යොමු කරන ලද්දේය. මේ ආයතනික ජාලය හරහා තෙවන ලොව රටවල කළ මැදිහත් වීම ජාතික තලයේ සිය පහළට ප්‍රාදේශිය මට්ටම දක්වා ව්‍යාප්ත වූයේය (Escobar, 1999).

මෙලෙස සංවර්ධනය පිළිබඳ පශ්චාත්-සංවර්ධන කතිකාවෙන් පෙන්වා දෙන්නේ නූතන සංවර්ධන දෘෂ්ටිවාදය සහ භාවිතය විසින් සංවර්ධිත බටහිර ලෝකයේ දැනුම පිළිබඳ බලය දුප්පත් යැයි කියූ ලෝකයට ව්‍යාප්ත කර ඇති බවයි. මේ ක්‍රියාවලිය හරහා බටහිර නොවන ලෝකයේ ජනතාව බටහිර ආකෘතියේ චින්තනයකට සහ හැසිරීම් පද්ධතියකට අනුගත කොට ඇති අතර සංවර්ධනයේ පරමාදර්ශී තත්ත්වයන් සහ වඩාත් හොඳ ජීවිතයක් පිළිබඳ අපේක්ෂාවන් හා සම්බන්ධ පරිකල්පනයන් නිර්මාණය කොට ඇත යන්න පශ්චාත්-සංවර්ධන න්‍යායවාදීන්ගේ තර්කයයි. ඒ අනුව මේ න්‍යායවාදීන් සඳහන් කරන්නේ සංවර්ධනය වාස්තවික යථාර්ථයක් නොව සංකල්පවේදිය නිමැවුමක් බවයි. ඒ ඔස්සේ සංවර්ධිත ලෝකය තමන්ට පාලනය කළ හැකි සහ කළමනාකරනය කළ හැකි ඌන-සංවර්ධනයක් නිර්මාණය කොට ඇති බව පශ්චාත්-සංවර්ධන කතිකාවේ ලේඛකයෝ සඳහන් කරති.

## IV කොටසඃ සමාලෝචනය

මෙම ලිපියේදි මූලික වශයෙන් අවධානය යොමු කරන ලද්දේ ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු ලෝකයේ දුගීභාවය සහ පහත් ජීවන තත්වය පිටුදැකීම අරමුණු කර ගනිමින් නූතන සංවර්ධන යුගය (1940 දශකයේ අග භාගයේදී) ඇරඹීමත් සමග සංවර්ධනය යන්න සංකල්පයක් ලෙස ගොඩනැගුණු ආකාරය පිළිබඳව (විවේචනාත්මක) ශාස්ත්‍රීය ඇගයුමක් වෙත යාමටය. සංවර්ධනය යන්නෙන් අපේක්ෂිත ඉලක්ක ආසියානු, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු ලෝකය විසින් අත්පත් කර ගත්තේද යන්නට වඩා සංවර්ධනය යන්න අගය දිශානතියක් ලෙස ගොඩනැගුණු ආකාරය සහ ඊට බලපෑ (ජාත්‍යන්තර) දේශපාලන-ආර්ථික පසුබිම පිළිබඳව මෙම ලිපියේදී විශේෂයෙන් අවධානය යොමු කරන ලද්දේය.

19 සහ 20 වන සියවස තුල බටහිර බලවේග (විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය) ඉන්දියාව, චීනය සහ බ්‍රසීලයේ පසුගාමීත්වයට සෘජුවම දායක වූ ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් සමෘද්ධිමත් නොවූ පසුගාමී ලෝකය යනු සමෘද්ධිමත් ලෝකයේ සමෘද්ධිමත් භාවයේ නිර්මිතයක් බව බටහිර විද්වතුන් විසින්ම පෙන්වාදී ඇත (Davis, 2000). මේ අනුව, මෙම ලිපියෙන් පෙන්වා දුන් ආකාරයට නූතන සංවර්ධන යුගය ආරම්භ වීමේදී මූලික වශයෙන් අපේක්ෂා කරන ලද්දේ සමෘද්ධිමත් ලෝකයට තර්ජනයක් විය හැකි යැයි උපකල්පනය කරන ලද සමෘද්ධිමත් නොවූ පසුගාමී ලෝකය නගා සිටුවීමයි. කෙසේ වෙතත්, ජාත්‍යන්තර වශයෙන් ලෝකයේ බලයේ ව්‍යාප්තිය පිළිබඳව එම යුගයේ ලෝක බලවතුන් අතර වූ තරගය පසුගාමී ලෝකය කෙරෙහි ලෝක බලවතුන්ගේ අවධානය යොමු වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය යන්න නොරහසකි. මෙම අවධානය යොමු කිරීමේ ක්‍රියාවලිය තුළින් පසුගාමී යැයි කියූ ලෝකයේ ජනතාව ඔවුන් එතෙක් අත් නොවිඳි සංවර්ධන චින්තනයකට සහ හැසිරීම් පද්ධතියකට අනුගත කොට අතර සංවර්ධනයේ පරමාදර්ශී තත්ත්වයන් සහ වඩාත් හොඳ ජීවිතයක් පිළිබඳ අපේක්ෂා හා සම්බන්ධ පරිකල්පනයන් නිර්මාණය කර ඇත්තේය යන්නද පැහැදිලිය. ඒ ඔස්සේ සංවර්ධිත ලෝකයේ බලවතුන්, ජාත්‍යන්තර සංවිධාන තමන්ට පාලනය කළ හැකි සහ මෙහෙයවිය හැකි ඌන සංවර්ධනයක් පසුගාමී යැයි කියූ ලෝකය අලුතින්ම නිර්මාණය කළ බවද මේ වන විට පර්යේෂකයන් විසින් තහවුරු කොට ඇත (Ferguson, 1990; 1994). මෙම ගොඩනැගීම තුළ ලෝක බලවතුන්, ජාත්‍යන්තර සංවිධාන සහ පසුගාමී යැයි කියූ ලෝකයේ රටවල ආණ්ඩු සහ ජනතාව සංවර්ධනය යන්න ක්‍රියාකාරි භාවිතයක් ලෙස පිළිගෙන ක්‍රියාත්මක කරන ලද්දේය. ඒ අනුව අත්පත් කරගත යුතු කාර්ය-සාධන අභිමතාර්ථයක් ළඟා කර ගැනීම අරමුණු කරගත් සැලසුම් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද්දේය.

සංවර්ධනය යන්න ප්‍රධාන වශයෙන්ම සංවර්ධනය වන කලාපය සඳහා විය යුතු වුවත්, නූතන සංවර්ධන යුගය ආරම්භ වීමෙන් අනතුරුවද සංවර්ධනය සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමෙරිකානු ලෝකයේ දුප්පත් රටවල ව්‍යුහාත්මක සහ ආයතනික වෙනස්වීම්, යටිතල පහසුකම් සංවර්ධනය, ආර්ථිකය නගා සිටුවීම ඇතුළු සංවර්ධන ක්‍රියාකාරකම්, අරමුණු, සැලසුම්, ප්‍රතිපත්තීන් යනාදි ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් කරන ලද විග්‍රහයන් සහ මැදිහත් වීම් සියල්ලම පාහේ සංවර්ධනය වෙමින් පවතින ලෝකයට පිටස්තර පුද්ගලයන්, පුද්ගල කණ්ඩායම්, ආයතනයන් විසින් කරන ලද ඒවා බව බැලූ බැල්මට පෙනී යයි. ඒ අනුව, සංවර්ධන ක්‍රියාවලියට භාජනය වන ප්‍රජාවගේ අදහස්, හෝ දායකත්වය නිර්මාණාත්මක ලෙස ලබා ගැනීම සඳහා වූ අවධානය සීමාසහිත වූ, එසේත් නැත්නම් එවැන්නක් අපේක්ෂා නොකළා වූ, එහෙත් එම ප්‍රජාව විසින් (ළඟා කර ගත යුතු යැයි කියූ) කිසියම් අගය දිශානතියක් වෙත යොමු කළා වූ සංකල්පමය භාවිතාවක්

**ISBN 978- 955-4563- 71- 1**

වශයෙන් නූතන සංවර්ධන යුගය තුළ සංවර්ධනය යන්න නිර්වචනය වී ඇත්තේ සංවර්ධන ක්‍රියාවලියට හසුවන බහුතරයක් ජනතාවගේ ස්වයං-විශ්වාසය තහවුරු නොකරමින්ය යන්න පිළිගැනීමට ඇති සාධක බෙහෙවින් වැඩිය.

## ආශ්‍රිත පඨිතයන්


Davis, Mike (2000) 'The Origine of the Third World' in *Antipode,* 32:1. Available at *onlinelibrary.wiley.com/doi/10.1111/1467-8330.00119/**pdf*** (accessed 30. 10. 2015).

Edelman, Marc and Angelique Haugerud (2004) 'Development,' in David Nugent and Joan Vincent (ed) *A Companion to the Anthropology of Politics*. Oxford: Blackwell Publishing

Edelman, Marc and Angelique Haugerud (ed) (2005) *The Anthropology of Development and Globalization: From Classical Political Economy to Contemporary Neoliberalism*. Oxford: Blackwell Publishing

Escobar, Arturo (1995) *Encountering Development: The Making and Unmaking of the Third World*. Princeton: Princeton University Press

Escobar, Arturo (1999) 'The Invention of Development,' in *Current History*, Vol: 98, No: 631:

Esteva, Gustavo (1992) 'Development', in Wolfang Sachs (ed.) *The Development Dictionary*. London: Zed

Ferguson, James (1990) *The Anti-Politics Machine: 'Development,' Depoliticization, and Bureaucrati c Power in Lesotho*. Cambridge: Cambridge University Press

Ferguson, James with Larry Lohmann (1994) 'The Anti-Politics Machine: "Development," and Bureaucratic Power in Lesotho' *in The Ecologist*, Vol. 24, No. 5

Foucault, Michel (1966) *The Order of Things: An Archaeology of the Human Sciences*. Paris: Gallimard.

Foucault, Michel (1969) *The Archaeology of Knowledge*. London: Routledge

Gore, Charles (2000) 'The rise and fall of the Washington consensus as a paradigm for developing countries,' in *World Development*, 28 (5): 789–804.

Greene, Bernard W. (1980) 'Toward a Definition of the Term Third World,' in *Boston College Third World Law Journal*, Vol. 1, Number 1, Winter: 13-36. Available at http://lawdigitalcommons.bc.edu/twlj/vol1/iss1/10 (accessed 30. 10. 2015).

*http://social.rollins.edu/wiki/population/index.php/Physical_Quality_of_Life_Index*.

*https://en.wikipedia.org/wiki/**Normandy**_landings* (accessed 15. 11. 2015)

Lewis, David and Kathy Gardner (1995) *Anthropology, Development and the Post-Modern Challenge*. London: Pluto Press

Morris, Morris David (1979) *Measuring the Condition of the World's Poor: The Physical Quality of Life Index*. New York: Pergamon Press. Available at *sites.jmu.edu/soci348/files/2012/05/**Morris**.pdf* (accessed 15.11.2015).

Morse, Stephen (2004) *Indices and Indicators in Development: An Unhealthy Obsession with Numbers*. London: Earthscan Publications Ltd

Nustad, Knut G (2001) 'Development: the devil we know?' in *Third World Quarterly*, Vol. 22, No. 04

Rapley, John (2007) *Understanding Development: Theory and Practice in the Third World*. Boulder: Lynne Rienner Publishers Ink

Rist, Gilbert (2002 [1997]) *The History of development: from Western Origins to Global Faith*. New Delhi: Academic Foundation

Rostow, W. W. (2004 [1960]) 'The Five Stages of Growth,' in Mitchell A. Seligson and John T. Pass-Smith (ed.) *Development and Underdevelopment: The Political Economy of Global Inequality*. New Delhi: Viva Books

Sachs, Wolfang (ed.) (1992) *The Development Dictionary*. London: Zed Books

Sant'Ana, Matthias (2008) *The evolution of the concept of development: from economic growth to human development*. Working Paper-PAI VI/06-FDI/HD-6. UCLouvain: Centre for Philosophy of Law

Seers, Dudly (1969) *The Meaning of Development*. Iitiute of Development Studies. Available at *https://www.ids.ac.uk/files/dmfile/the**meaningofdevelopment**.pdf* (accessed 15.11.2015).

Sen, Amartya (1988) 'The Concept of Development,' in H. Chenery and T. N. Srinivasan (ed.) *Handbook of Development Economics, Volume 1*. B.V.: Elsevier Science Publishers

ISBN 978- 955-4563- 71- 1

Summer, Andy and Michael Tribe (2008) *International Development Studies: Theories and Methods in Research and Practice*. London: Sage

Szirmai, Adam (2005) *The Dynamics of Socio-Economic Development: An Introduction*. Cambridge: Cambridge University Press

Thomas, Allan (2004) *The Study of Development*. Paper prepared for DSA Annual Conference, 6 November, Church House, London.

Thomas, Allan (2000) 'Development as practice in a liberal capitalist world,' *Journal of International Development*, 12 (6): 773–787.

Tipps, Dean C. (1973) 'Modernization Theory and the Comparative study of Societies: A Critical Perspective,' *Comparative Studies in Society and history*, 15 (2): 199-226

Todaro, Michael P. and Stephen C, Smith (ed) (2012) Economic Development. Noida (India): Pearson

UNDP (1991) *Human Development Report 1991*. New York: Oxford University Press for the UNDP. Available at *hdr.undp.org*/sites/*default/.../**reports**/.../hdr_**1991**_en_complete_nostats.p (accessed 16. 11. 2015)*

United Nations (2013) *Realizing the Right to Development: Essays in Commemoration of 25 Years of the United Nations Declaration on the Right to Development.* New York and Geneva: United Nations Publication. Available at. www.ohchr.org/Documents/.../**RightDevelopmentInteractive**_EN.pdf (accessed 15. 08.2015)

United Nations (2015) *The Millennium Development Goals Report*. New York: United Nations Available at. *www.un.org/...**MDG**.../**pdf/MDG**%202015%20Summary%20web_englis*... (accessed 16. 11. 2015).

WCED (1987) *Report of the World Commission on Environment and Development: Our Common Future*. Available at, *www.un-documents.net/our-common-future.pdf* (accessed 15.11. 2015).

Willis, Katie (2005) *Theories and Practice of Development*. London: Rutledge

Wilson, Harold (*1953) The war on world poverty: An appeal to the conscience of mankind.* London: Gollancz